*1 වැනි පරිච්ඡේදය*

# ආර්ථික හා මූල්‍ය ස්ථායීතාවය, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති


## 1.1 2005 වසරෙහි සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායීතාවය සහ ප්‍රතිපත්ති සඳහා පැවති ප්‍රතිචාර

- **ශ්‍රී ලංකා ආර්ථිකය 2005 වසරේදී සියයට 6 ක වේගයකින් වර්ධනය වෙමින් සහ 2004 වසරේ සිදු වූ සුනාමි ව්‍යසනයෙන් පසු අපේක්ෂා කළ ආර්ථික වර්ධනය අභිබවා යමින් ව්‍යසනයන්ට සහ කම්පනයන්ට මුහුණ දී යළි ප්‍රකෘති තත්ත්වයට පත්වීමට ඇති හැකියාව නැවත වරක් නිරූපණය කළේය. විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග සහ සමස්ත සැපයුමෙහි හිතකර වර්ධනයන් තුළින් උද්ධමනය පහත වැටුණි. ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව අධීක්ෂණය සහ නියාමනය වර්ධනය කිරීම තුළින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ශක්තිමත් කෙරිණි.** දේශීය හා විදේශීය කම්පන සහ ඒ ආශ්‍රිත අවිනිශ්චිතතා තුළින් පැන නැගුණු අභියෝග කිහිපයක් සමඟ වසර ආරම්භ විය. සුනාමි ව්‍යසනය නිසා ඇති වූ හානි ඉක්මණින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් අවශ්‍යවීම, තෙල් මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළයාම, 2005 ජනවාරි 1 ද සිට බහුවිධ කෙඳි ගිවිසුම (Multi - Fibre Arrangement - MFA) අවසන්වීම සහ මැතිවරණ හා සම්බන්ධ අවිනිශ්චිතතා පැවතීම යනාදිය මෙම අභියෝගයන් සහ ඉන් මතුවන අවිනිශ්චිතතාවලට ඇතුළත් විය. මීට අමතරව, සාම ක්‍රියාදමය ඇණහිට තිබුණි. වසර ගතවීමත් සමඟ, එම අවිනිශ්චිතතා ක්‍රමයෙන් අඩු වූ අතර, මිල ස්ථායීතාවය සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති නිසි පරිදි හැසිරවීම පිණිස ප්‍රමාණවත් ඉඩකඩක් සපයමින් ආර්ථිකය නව ශක්තියකින් යුතුව ඉදිරියට ගමන් කළේය. ඉහළ ආර්ථික වර්ධනය සහ සාපේක්ෂ වශයෙන් අඩු ජනගහන වර්ධනය හේතුවෙන් ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 1,197 ක මට්ටමක් දක්වා තවදුරටත් වර්ධනය විය. මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගවලට සහ සමස්ත සැපයුමෙහි හිතකර වර්ධනයන්ට අනුකූලව 2005 පෙබරවාරි මාසයේ සියයට 15.9 ක් වැනි ඉහළ මට්ටමක පැවති උද්ධමනය 2005 දෙසැම්බර් මස අවසානය වනවිට සියයට 8 ක් දක්වා ක්‍රමයෙන් අඩු වූ අතර, 2005 වර්ෂයෙහි සාමාන්‍ය උද්ධමනය සියයට 11.6 ලෙස වාර්තා විය. සේවා වියුක්ති අනුපාතිකය 2004 දී සියයට 8.3 ක සිට 2005 අගෝස්තු මාසය වනවිට සියයට 7.7 ක් දක්වා පහත වැටිණි. විදේශ සංචිත ශක්තිමත් කරමින් සහ විනිමය අනුපාතිකයෙහි ස්ථායීතාවයට දායක වෙමින් ගෙවුම් තුලනය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 501 ක අතිරික්තයක් වාර්තා කළේය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තවදුරටත් වැඩි දියුණු වූ අතර, එය විශේෂයෙන්ම ආදායම් අංශයෙහි දක්නට ලැබිණි. මූල්‍ය අංශයෙහි අවදානම් කළමනාකරණය වැඩි දියුණු වීම, ලාභ ඉහළයාම සහ පොලී අන්තරය අඩු වීමත් සමඟ එහි ස්ථායීතාව සහ කම්පනයන්ට ඔරොත්තුදීමේ හැකියාව තවදුරටත් වර්ධනය වූ අතර, මූල්‍ය අංශයෙහි මූල්‍ය පහසුකම් සඳහා ඇති ඉඩ ප්‍රස්තා ද වඩා පුළුල් විය.

- **දිළිඳුකම පිටුදැකීම, සේවා වියුක්තිය අඩු කිරීම සහ තිරසාර පදනමක් මත ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ආර්ථික වර්ධනය අවම වශයෙන් සියයට 8 ක් දක්වා තවදුරටත් වේගවත් වීම අවශ්‍ය වේ.** මෙම අපේක්ෂිත ආර්ථික වර්ධනය ළඟාකර ගැනීම සඳහා වන රජයේ සැලසුම් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි සහ විශේෂයෙන්ම, 'මහින්ද චින්තන' ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි විස්තර කර ඇත. ආර්ථික වර්ධනය මෙන්ම එම වර්ධනය දිරි ගැන්වීමේ පූර්ව අවශ්‍යතා ශක්තිමත් කරන අතරතුර, කාර්යක්ෂම පෞද්ගලික අංශයක් සමඟ පහසුකම් සපයන රාජ්‍ය අංශයක් එක්ව කටයුතු කිරීමේ අවශ්‍යතාවය රජය අවධාරණය කර ඇත. රජයේ සැළසුම් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් වෙළෙඳපොළට ප්‍රවිෂ්ට වීමේ මාර්ග වැඩි දියුණු කිරීම, මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනයන් කිරීම සහ තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවසායකයින් දිරිමත් කිරීම,


**1.1 රූප සටහන**

**කාර්තුමය මූර්ත ද.දේ.නි යේ වර්ධනය සහ උද්ධමනය**




**1.2 රූප සටහන**

**ඉතිරිකිරීම් සහ ආයෝජන**



## 1.1 සංඛ්‍යා සටහන
## ස්ථාවර මිල යටතේ (1996) දළ ජාතික නිෂ්පාදිතය

| අංශය | වටිනාකම (රු.ද.ල) | | ද.දේ.නි.% ලෙස | | වෙනස්වීමේ අනුපාතිකය% | | වෙනස්වීමේ දායකත්වය% | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2004(අ) | 2005(ආ) | 2004(අ) | 2005(ආ) | 2004(අ) | 2005(ආ) | 2004(අ) | 2005(ආ) |
| **කෘෂිකාර්මික අංශය** | 175,852 | 178,475 | 17.9 | 17.2 | -0.3 | 1.5 | -1.2 | 4.4 |
| කෘෂිකර්මය | 135,967 | 147,909 | 13.9 | 14.2 | -0.9 | 8.8 | -2.3 | 20.2 |
| දැව | 17,107 | 17,400 | 1.7 | 1.7 | 1.3 | 1.7 | 0.4 | 0.5 |
| ධීවර | 22,779 | 13,166 | 2.3 | 1.3 | 1.6 | -42.2 | 0.7 | -16.3 |
| **කාර්මික අංශය** | 259,286 | 280,696 | 26.4 | 27.0 | 5.2 | 8.3 | 25.4 | 36.3 |
| පතල් හා කැනීම් කටයුතු | 16,946 | 19,335 | 1.7 | 1.9 | 7.9 | 14.1 | 2.5 | 4.0 |
| නිමැවුම් කර්මාන්ත | 159,721 | 169,337 | 16.3 | 16.3 | 5.1 | 6.0 | 15.3 | 16.3 |
| විදුලිය, ගෑස් සහ ජලය | 14,287 | 17,610 | 1.5 | 1.7 | -2.5 | 23.3 | -0.7 | 5.6 |
| ඉදිකිරීම් | 68,332 | 74,414 | 7.0 | 7.2 | 6.6 | 8.9 | 8.3 | 10.3 |
| **සේවා අංශය** | 545,582 | 580,564 | 55.7 | 55.8 | 7.6 | 6.4 | 75.8 | 59.3 |
| තොග සහ සිල්ලර වෙළෙඳාම, හෝටල් සහ අවන්හල් | 219,041 | 224,652 | 22.3 | 21.6 | 6.1 | 2.6 | 24.7 | 9.5 |
| ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 142,727 | 160,882 | 14.6 | 15.5 | 13.7 | 12.7 | 33.9 | 30.8 |
| මූල්‍ය සේවා, දේපළ වෙළඳම් සහ ව්‍යාපාරික සේවා | 114,661 | 122,127 | 11.7 | 11.7 | 5.6 | 6.5 | 12.0 | 12.7 |
| රාජ්‍ය පරිපාලනය, අනෙකුත් රාජ්‍ය සේවා සහ ආරක්ෂක කටයුතු අනෙකුත් ප්‍රජා, සමාජීය සහ පෞද්ගලික | 69,153 | 72,903 | 7.1 | 7.0 | 3.9 | 5.4 | 5.1 | 6.4 |
| **දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | 980,720 | 1,039,735 | 100.0 | 100.0 | 5.4 | 6.0 | 100.0 | 100.0 |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | -11,300 | -16,526 | | | 19.3 | 46.2 | | |
| **දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.)** | 969,421 | 1,023,209 | | | 5.3 | 5.5 | | |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


ප්‍රතිපත්තිවල අනුරූපීබව සහ ස්ථායීතාවය තහවුරු කිරීම තුළින් රටෙහි සෑම පෙදෙසකම ආයෝජන ප්‍රවර්ධනය කිරීම, ආයතනික පහසුකම් වර්ධනය කිරීම මෙන්ම පර්යේෂණ හා සංවර්ධන සඳහා දිරිගැන්වීම් වැනි ද අන්තර්ගත වේ. මෙම උත්සාහයන්හි සාර්ථකත්වය සඳහා සමස්ත ආර්ථිකයෙහිම කාර්යක්ෂමතාවය තවදුරටත් වර්ධනය කිරීම පිණිස නිසි ප්‍රතිසංස්කරණ (Reforms) ක්‍රියා මාර්ග අත්‍යවශ්‍යය. අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණයන් සඳහා මහජන සහාය ලබාගනු වස් රජයේ කාර්යභාරය සහ එහි සීමාවන්, ආර්ථික ලිහිල්කරණයෙහි හා ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිලාභ, තරගකාරීත්වය වර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ කාර්යභාරය සහ ඔවුන්ගේ ස්වෝත්සාහයෙන් දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ටවීම වර්ධනය කර ගැනීම යනාදිය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ පුළුල් වැඩ සටහන් දියත් කිරීම ද අවශ්‍ය වේ.

- **ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාවට දැඩි සීමාවන්ට මුහුණ දීමට සිදුවන හෙයින් ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් දියත් කිරීම කාලෝචිත වේ.** සෑම අංශයකම වර්ධනයට බලපාන බල ශක්ති ක්ෂේත්‍රයේ මෙම ධාරිතා සීමාවන් කැපී පෙනුණි. මහා මාර්ග, දුම්රිය මාර්ග, වරාය පහසුකම්, පණිවුඩ හුවමාරුව හා වාරිමාර්ග වැනි අංශවල ධාරිතාවයේ සීමාවන් හේතුවෙන් ආයෝජනය, ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය හා ජාත්‍යන්තර තරගකාරීත්වය යන ක්ෂේත්‍රයන් දැඩි පසුබෑමකට ලක් වී තිබේ. නිවාස සංවර්ධනයේ ශීඝ්‍ර ඉහළයෑම දැනටමත් දුර්වල තත්ත්වයක පවතින මහජන උපයෝගීතා සේවාවන් අමතර පීඩනයකට භාජනය කරයි. පුද්ගලයින් විශාල

### 1.3 රූප සටහන
### ඛනිජ තෙල් ආනයන වටිනාකම සහ ආනයනය කරන ලද බොරතෙල්වල සාමාන්‍ය මිල




### 1.4 රූප සටහන
### ගෙවුම් තුලනය



**විශේෂ සටහන 1**

## ආර්ථික වර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනය කඩිනම් කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන්

රජය විසින් ආර්ථික වර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනය කඩිනම් කිරීම සඳහා මෙන්ම තිරසාර පදනමකින් ප්‍රාදේශීය අසමතුලිතතාවයන් හා දිළිඳුකම අඩුකිරීම සඳහා වන සිය ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් ප්‍රතිපත්ති ලේඛන රාශියක් තුළින් ප්‍රකාශයට පත්කර ඇත. එම ලේඛනවලට, ශ්‍රී ලංකා නව සංවර්ධන ක්‍රමෝපාය - ආර්ථික වර්ධනය සහ දිළිඳුකම අඩුකිරීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව 2005, ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාවේ වාර්තාව, සහශ්‍ර සංවර්ධන ඉලක්ක - ශ්‍රී ලංකා වාර්තාව 2005, මධ්‍යකාලීන වියදම් රාමුව : 2006 - 2008, 2005 හා 2006 වසරවල අයවැය කථා, සහ මහින්ද චින්තනය ඇතුළත් වේ. ප්‍රතිපත්ති හා ක්‍රමෝපායයන් සම්පාදනය කිරීමේ දී රජය විසින් ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා වන පූර්ව අවශ්‍යතාවන් මෙන්ම ආර්ථික වර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අවශ්‍ය වන සාධක ද හඳුනාගනු ලැබ ඇත. ඉහත දක්වා ඇති ලේඛනවල අඩංගු ප්‍රධාන ප්‍රතිපත්ති හා ක්‍රමෝපායයන් පිළිබඳව සංක්ෂිප්තයක් පහත දැක්වේ.

**අ. ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා පූර්ව අවශ්‍යතා වැඩිදියුණු කිරීම.**

- **සාමය :**

  සාම ගිවිසුම ශක්තිමත් කිරීම හා අදාළ පාර්ශ්වයන් සමග අන්‍යෝන්‍ය එකඟතාවය ගොඩනැංවීම මගින් තිරසාර සාමයක් සඳහා සාකච්ඡාමය විසඳුමක් ඇතිකර ගැනීමට කටයුතු කිරීම.

- **නීතිය හා නියාමන පද්ධතිය :**

  ව්‍යාපාර කටයුතු සම්බන්ධ වියදම් අඩුකිරීමට සහ ව්‍යාපාර පරිසරය වැඩිදියුණු කිරීම සඳහා රටෙහි නීති හා නියාමන පද්ධතිය නවීකරණය කිරීම, විශේෂිත පුහුණුව ලබාදීම තුළින් අධිකරණ හා නීති වෘත්තීන්හි හැකියාවන් ශක්තිමත් කිරීම සහ වාණිජ නීති ප්‍රතිසංස්කරණය කිරීම, භෞතික යටිතල පහසුකම් හා තාක්ෂණය නවීකරණය කිරීම, හැකියාවන් ශක්තිමත් කිරීම සහ පැරණි නීතිරීති ඉවත්කිරීම හෝ සංශෝධනය කිරීම තුළින් නීති ප්‍රතිසංස්කරණ ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත.

- **නීතිය හා සාමය, සුරක්ෂිතභාවය, දේපළ අයිතීන් හා ඵලදායී ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම :**

  අපරාධ සංඛ්‍යාව අඩුකිරීම, අධිකරණ ක්‍රමය වෙත ජනතාවට ප්‍රවිශ්ට වියහැකි මාර්ග වැඩිදියුණු කිරීම, ව්‍යාපාර කටයුතු වැඩිදියුණු කිරීම හා දේපළ අයිතීන් සුරැකීම සඳහා පහසුකම් සැලසීම පිණිස පවත්නා නීති හා නියාමන වාතාවරණය ප්‍රවර්ධනය කිරීමට අධිකරණ ක්‍රමය යටතේ ඇති පිළියම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සහ නීතිය හා සාමය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීම.

- **ප්‍රතිපත්තිමය ස්ථායීතාව සහ ප්‍රතිපත්තීන්හි නිසි ගැළපීම, විනිවිදභාවය, වගකිවයුතුභාවය හා පාලනය :**

  ප්‍රතිපත්තිමය ස්ථායීතාව වැඩිදියුණු කිරීම, ප්‍රතිපත්තිවල නිසි ගැලපීමක් පවත්වා ගැනීම, මිලදී ගැනීම් සිදුකිරීමේදී විනිවිදභාවය හා වගකිවයුතුභාවය ආරක්ෂා කිරීම, ප්‍රමාදවීම් හා අකාර්යක්ෂමතාවයන් නැති කිරීම සඳහා රජයේ මිලදී ගැනීමේ ක්‍රමය ශක්තිමත් කිරීම හා වඩාත් විධිමත් කිරීම සඳහා අවශ්‍ය වන හැකියාවන් වැඩිදියුණු කිරීම හා ඒ හා බැඳි ප්‍රතිපත්තිමය ගැටලු නිරාකරණය කිරීම, මහජනතාවට තොරතුරු ලබා ගැනීමට හැකි මාර්ග වැඩිදියුණු කිරීම, රජයේ ව්‍යාපාරවල වාර්ෂික ගිණුම් නිසි කලට ප්‍රකාශයට පත්කිරීම හා විගණනය කිරීමේ හා වාර්තා කිරීමේ ප්‍රමිතීන් හා ක්‍රමයන් ශක්තිමත් කිරීම.

- **ආරක්ෂණ ආවරණය (Safety Net) සහ සමාජ ආරක්ෂණය :**

  සමාජයේ වඩාත් පීඩාවට පත්වීමට ඉඩ ඇති පුද්ගලයින්ට ඵලදායී ආර්ථික කටයුතුවල නියුතුවීමට පහසුකම් සලසා දීම, ආබාධිතයන් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් රැකබලා ගැනීමට පහසුකම් ලබාගත හැකි මාර්ග පුළුල් කිරීම, හා එවැනි සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යනාදිය ඇතුළුව නිසි ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ග තුළින් පීඩාවට පත්විය හැකි හා අඩු වරප්‍රසාදලාභී පුද්ගලයින් ආරක්ෂා කිරීම, වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම.

- **පරිසරය සුරැකීම :**

  පරිසරය සුරැකීමට නිසි අවධානය යොමුකරමින් තිරසාර සංවර්ධනය වැඩිදියුණු කිරීම.

**ආ. ආර්ථික වර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වන සාධක :**

- **ආර්ථිකයේ ධාරිතාවය පුළුල් කිරීම :**

  ආයතනමය ප්‍රතිසංස්කරණ, වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ හා රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ යනාදී සුදුසු ප්‍රතිසංස්කරණ හරහා රාජ්‍ය, පෞද්ගලික හා විදේශීය ආයෝජන වැඩිදියුණු කිරීම තුළින් ආර්ථිකයේ සියලුම අංශයන්හි නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීම.

- **මානව සම්පත් සංවර්ධනය :**

  සියලුම මට්ටම්වල අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය හා අදාළ බව වැඩිදියුණු කරන අතර, පවත්නා අවස්ථාවන් උපරිම කිරීම හා අධ්‍යාපනය ලබාගැනීමට ඇති ඉඩකඩ පුළුල් කිරීම මගින් ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන ආයතන ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම, තත්ත්වයෙන් උසස්, සමානාත්මක, පිරිවැය අතින් ඵලදායී, නවීන හා තිරසාර සෞඛ්‍ය සේවාවක් ලබාදීම.

- **යටිතල පහසුකම් සංවර්ධනය :**

  යෙදවුම් හා නිමැවුම් වෙළෙඳපොළවල් වෙත පිවිසිය හැකි මාර්ග පුළුල් කිරීම සඳහා නවීන, උසස් තත්ත්වයේ හා කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක් ගොඩනැංවීම, පවත්නා මාර්ග පද්ධතිය නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, අධිවේගී මාර්ග ගොඩනැංවීම, ආරක්ෂිත පානීය ජලය භාවිතා කිරීම වැඩිකිරීම, දුම්රිය අංශය වැඩිදියුණු කිරීම, ක්‍රියාත්මක වෙමින් පවත්නා බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම තුළින් විදුලිබලය සැපයුම, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම පුළුල් කිරීම සහ සමාජීය ප්‍රශ්න හා පාරිසරික බලපෑම් සැලකිල්ලට ගනිමින් විදුලිය සඳහාවන පිරිවැය අඩුකිරීම සඳහා විකල්ප බලශක්ති සංවර්ධනය කිරීම සහ ගුවන් තොටුපොළ හා වරාය අංශයන් ගුවන් හා මුහුදු මධ්‍යස්ථාන (air-sea hub) සහ පහසුකම් සපයන මධ්‍යස්ථාන (logistic centre) බවට පරිවර්තනය කිරීම.

- **තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධන වැඩිදියුණු කිරීම :**

  නවීන තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රටෙහි පර්යේෂණ හා සංවර්ධන කටයුතු පවත්වාගෙන යෑම.

## ඇ. ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ග :

- **ජාතික ආර්ථික ප්‍රතිපත්ති රාමුව :**

  සමාජීය වශයෙන් වගකිය යුතු පෞද්ගලික අංශයක් හා ශක්තිමත් රාජ්‍ය අංශයක ඒකාබද්ධ සහභාගිත්වය සහිත, නවීන හා සමබර යොමුවක් සහතික කරන පරිදි නිදහස් ආර්ථිකයක පවත්නා ධනාත්මක තත්ත්වයන් ඒකාබද්ධ කරමින් සමස්ත ආර්ථික ප්‍රතිපත්තිය සකස්කර ඇත.

- **ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති න් :**

  ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයක් පවත්වාගෙන යෑම.

  **රාජ්‍ය මූල්‍ය :**

  වර්තන ගිණුමේ හිඟය අතිරික්තයක් බවට පරිවර්තනය කර ගැනීම, ප්‍රධාන වශයෙන් විදේශීය සහනදායී මාර්ගවලින් හා දිගුකාලීන දේශීය වෙළෙඳපොළ මගින් ලබාගන්නා ණය හරහා රාජ්‍ය ආයෝජනය ඉහළ නැංවීම, දේශීය බැංකු ක්‍රමය තුළින් ලබාගන්නා ණය මගින් අයවැය හිඟය මූල්‍යනය කිරීම නතර කිරීම, හා රාජ්‍ය ව්‍යවසායයන්වලට අයවැයෙන් කෙරෙන පැවරුම් ක්‍රමානුකූලව අඩුකිරීම, රාජ්‍ය වියදම් කළමනාකරණ ක්‍රම දියුණු කිරීම මගින් රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීම, රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කිරීම, බදු පරිපාලනයෙහි ඵලදායිතාවය වැඩිදියුණු කිරීම හා රාජ්‍ය මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම.

- **මුදල් හා මූල්‍ය :**

  ඉල්ලුම මගින් ජනිත කරනු ලබන උද්ධමනය අවමකිරීම, ආර්ථික කටයුතු තිරසාරව සිදුකිරීම සඳහා අවශ්‍ය ණය සුදුසු වර්ධන වේගයකින් පවත්වාගෙන යෑම, මූල්‍ය අංශයේ ස්ථාවරභාවය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය අංශය තවදුරටත් ශක්තිමත් කිරීම, බැංකු, රක්ෂණ හා මූල්‍ය සේවා නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම, බැංකු නොවන මූල්‍ය ආයතන අංශය සඳහා තනි නියාමන ආයතනයක් ඇති කිරීම, පොලී අනුපාතික අන්තරය අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහ රාජ්‍ය බැංකුවල මූල්‍යමය ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම සඳහා සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ දැඩි ලෙස හා ඵලදායී ලෙස තරගකිරීමට හැකිවන පරිදි ඒවා උපායමාර්ගික රාජ්‍ය ව්‍යවසාය ලෙස ශක්තිමත් කිරීම.

- **ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති :**

  **වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ:**

  ආර්ථිකයෙහි කාර්යක්ෂමතාවය හා තරගකාරිත්වය සහතිකවන පරිදි නිෂ්පාදන හා සාධක වෙළෙඳපොළවල් ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රතිසංස්කරණ අවශ්‍ය ප්‍රධාන වෙළෙඳපොළවල් වන්නේ ඉඩම්, කම්කරු හා මූල්‍ය වෙළෙඳපොළ යන අංශයන්ය. නිෂ්පාදන වෙළෙඳපොළ සඳහා විවෘත හා නිදහස් ආර්ථික ප්‍රතිපත්තියක් අඛණ්ඩව පවත්වාගෙන යෑම තුළින් රටට හිතකර ප්‍රතිඵල ලබාදී තිබේ.

  **යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ :**

  ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා සහභාගිවීමට රටපුරා විහිදුණු කාර්යක්ෂම හා වේගයෙන් වර්ධනය වන යටිතල පහසුකම් පද්ධතියක් රටට අවශ්‍ය වේ. බලශක්තිය, ජලය, ප්‍රවාහනය හා අනෙකුත් සේවාවන් වැනි අත්‍යවශ්‍ය සේවාවන් සපයන රාජ්‍ය අංශයේ ආයතන වැදගත් සේවාවන් සපයන රජයේ ආයතන වේ. මෙම ආයතන බොහොමයක් රාජ්‍ය අංශයේ ඒකාධිකාරී ආයතන වේ. කෙසේ වුවද, ඒවායින්

සපයන සේවාවන්හි තත්ත්වය, සේවා සපයන ප්‍රමාණය හා ඒවායෙහි මූල්‍ය තත්ත්වය ඉතා අසතුටුදායක තත්ත්වයක පවතී. එහෙයින් එම ආයතන උපායමාර්ගික ප්‍රතිසංස්කරණයන්ට යටත්විය යුතු ඒවා ලෙස හඳුනාගෙන ඇත.

**රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ :**

රාජ්‍ය සේවය පහසුකම් සලසන්නා, ආරක්ෂාව සලසන්නා සහ නායකත්වය ලබාදෙන්නා ලෙස සිය කාර්යභාරය ඉටු කරනු ඇත. වෙනස්වීම්වලට අනුකූලව සකස්වීම සහ සංවර්ධනය ද ඇතුළත්ව අනාගතයේදී ඇතිවිය හැකි ඉල්ලුම නව ක්‍රම යොද ගනිමින් සපුරාලීම පිණිස මුහුණදිය හැකි පරිදි රාජ්‍ය සේවයේ සමස්ත දර්ශනය සකස්විය යුතුව ඇත.

**ආයතනික ප්‍රතිසංස්කරණ :**

විනිවිදභාවය හා නවීන තාක්ෂණය භාවිතා කිරීමට වැඩි අවධානය යොමුකරමින් වර්තමාන අවශ්‍යතාවයන්ට නිසි ලෙස අවධානය යොමුකර ඇති බව සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතනවල කටයුතු වඩාත් තර්කානුකූල ලෙස ප්‍රතිසංස්කරණය කිරීම හරහා රජයේ පරිපාලන යාන්ත්‍රණය කාර්යක්ෂම, පුරවැසියන්ට හිතවත් හා නවීන එකක් බවට පත්කිරීමට ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනු ඇත.

සංඛ්‍යාවක් අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා විදේශ රටවලට යෑම, ප්‍රමාණවත් නොවන කළමනාකරණ, නිපුණතා සහ පෞද්ගලික හා රාජ්‍ය අංශවල පර්යේෂණ සහ නවෝත්පාදන කටයුතු අඩු මට්ටමක පැවතීම යනාදිය තුළින් මානව සම්පත් සංවර්ධනයේ ධාරිතා වර්ධනය ප්‍රමාණවත් නොවන බව පිළිබිඹු කෙරේ.

- **ආර්ථිකයේ ප්‍රධාන අංශ සියල්ලම 2005 දී මනා ලෙස වර්ධනය විය**. කෘෂිකාර්මික අංශය සියයට 1.5 කින් වර්ධනය වූ අතර, කාර්මික අංශය සියයට 8.3 කින්ද, සේවා අංශය සියයට 6.4 කින් ද වර්ධනය විය. 2005 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට මෙම අංශයන් තුනෙහි දායකත්වය පිළිවෙලින් සියයට 4.4 ක්, සියයට 36.3 ක් සහ සියයට 59.3 ක් විය.

- **කෘෂිකාර්මික අංශය 2004 වසර තුළ වූ පසුබෑමෙන් පසුව යළි යථා තත්ත්වයට පත් විය**. 2005 දී වී සහ තේ නිෂ්පාදනයන්හි නව වාර්තාවන් පිහිටුවිණි. මහ සහ යල කන්න දෙකෙහිම වී අස්වනු පිළිවෙලින් මෙට්‍රික් ටොන් 2,013,000 සහ මෙට්‍රික් ටොන් 1,233,000 ක් සේ ඓතිහාසික ඉහළම නිෂ්පාදන මට්ටමක් වාර්තා කළේය. තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 317.2 ක නව වාර්තාවක් තැබීය. රබර්, එළවළු සහ අනෙකුත් කෘෂි බෝග නිෂ්පාදිතයන් ද 2005 දී වර්ධනය විය. පොල් නිෂ්පාදනය අඩු වූ අතර, මත්ස්‍ය නිෂ්පාදනය සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත්නොවූවද, 2006 දී එම නිෂ්පාදිත යථා තත්ත්වයට පත්වන ලකුණු පෙන්නුම් කෙරේ.

- **තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා ඵලදායීතාව ඉහළ නැංවීමේ ක්‍රියා මාර්ග ගැනීම සහ මූල්‍ය සම්පත් ලබා ගැනීමේ අවකාශයන් පුළුල් කිරීම. ඉඩම් ලබාදීම. යටිතල පහසුකම් ඇති කිරීම සහ අධික මිල උච්චාවචනයන් සමනය කිරීම සඳහා වෙළෙඳපොළ පාදක කරගත් ක්‍රමෝපායයන් වැඩි දියුණු කිරීම වැනි ක්‍රියා මාර්ග අවශ්‍ය වේ**. තාක්ෂණය, පර්යේෂණ, ව්‍යාප්ති සේවා සහ පසු-අස්වනු අපතේ යාම් අඩුකර ගැනීම තුළින් ඵලදායීතාවය සහ ලාභදායීතාවය වැඩි දියුණු කළ හැකිය. මූල්‍ය සම්පත් සහ ඉඩම් ලබා ගැනීමට හැකි ප්‍රවේශයන් වර්ධනය කිරීමට සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට රජය දැනටමත් අවශ්‍ය පියවර ගෙන තිබේ. අහිතකර මිල උච්ඡාවචනයන් වැළැක්විය හැකි වනසේ වෙළෙඳපොළ මත පදනම් වූ ක්‍රම තවදුරටත් සංවර්ධනය කරමින් පවතී. අස්වනු නෙලන කාලයේදී වී සහ විවිධ එළවළු වර්ගවල ගොවිපළ මිල අඛණ්ඩව පහත වැටීමෙන් පැහැදිලි වන්නේ තරගකාරී වෙළෙඳපොළ බලවේගයන් ක්‍රියාත්මක නොවන බවයි. මෙය, වී සහ එළවළු වගා කරන ප්‍රදේශයන්හි තරගකාරීත්වයට පටහැනි කටයුතු සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස සහ දුර්වල යටිතල පහසුකම් නිසා සිදු විය හැකිය. එබැවින්, ගොවිපල මිල අඩු මට්ටමක පැවතීමේ ගැටලුවට වෙළෙඳපොළ පාදක කරගත් කල් පවත්නා විසඳුමක් ගෙන ඒම සඳහා රජය විසින් පවත්නා වෙළෙඳපොළ කටයුතු ගැඹුරින් පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.

- **2005 මුල් කාලසීමාව තුළ පැවති අවිනිශ්චිතතා සහ තෙල් මිල ඓතිහාසික ඉහළ මට්ටමක් දක්වා වැඩිවීමේ තත්ත්වයන් යටතේ වූවද. කාර්මික අංශයේ වර්ධනය. විශේෂයෙන් රෙදිපිළි සහ ඇඟලුම් උප අංශයෙහි වර්ධනය අඛණ්ඩව සිදු විය**. 2005 දී බහුවිධ කෙඳි ගිවිසුම අවසන් වීමත් සමඟ ප්‍රධාන වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ට වීමේ මාර්ග වර්ධනය කිරීම සඳහා වන උපාය මාර්ගයන් රජය දැඩි ලෙස ක්‍රියාත්මක කළේය. ව්‍යවසායකයන් විසින් නව වෙළෙඳපොළවල් ආකර්ෂණය කර ගැනීමට අනුගමනය කළ ක්‍රියා මාර්ගයන් සහ පවතින වෙළෙඳපොළවල් තහවුරු කිරීමට ආයතන මට්ටමින් දරන ලද පරිශ්‍රමයන් ද මේ සඳහා උපකාරී විය. ශ්‍රී ලංකාවේ පවත්නා ඉහළ ශ්‍රම සහ පාරිසරික ප්‍රමිතීන්, වෙළෙඳ සහ ආයෝජන වර්ධනයට හිතකර ප්‍රතිපත්තිමය වාතාවරණය සහ ඉහළ සාක්ෂරතාවයකින් යුතු ශ්‍රම බලකාය මෙම ක්‍රියාදමය සඳහා උපකාරී විය.

වෙළෙඳ සංවිධානයෙහි සේවා සඳහා වන පොදු වෙළෙඳ ගිවිසුම සමඟ (GATS) එකඟතාවන් කිහිපයක් ඇති කරගෙන තිබේ. එම අංශයන්හි වර්ධනයන් මගින් පෙන්නුම් කර ඇති ආකාරයට එම අංශ ලිහිල්කරණය නිසා රටට සැලකිය යුතු ප්‍රතිලාභ උත්පාදනය කර ඇත.

දේශීය වශයෙන් කරනු ලබන නියාමනයන් භාණ්ඩ වෙළෙඳමට වඩා සේවා වෙළෙඳමට වඩාත් වැදගත් වී ඇත. අවශ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාම, ගෙවීම් ක්‍රම විධිමත් කිරීම, දේශීය සේවා නියුක්තිය ආරක්ෂා කිරීම මෙන්ම ඒ සම්බන්ධ ජාතික ප්‍රශ්න විසඳීම සඳහා සේවා අංශයේ වෙළෙඳම පාලනය කිරීමට රෙගුලාසි සම්පාදනය කර ඇත. වෘත්තීය සේවාවන්වලදී අනුගමනය කරන නියමයන්, සමහර මූල්‍ය සේවාවන් වළක්වාලීමට ප්‍රාග්ධන ගිණුමෙහි පවත්නා අවහිරතාවයන් සහ රට තුළට සේවාවන් සහ සේවා සැපයුම්කරුවන් නිදහසේ ඇතුළුවීම වළක්වාලීමට පනවන ලද රෙගුලාසි ආදිය මේ සඳහා උදහරණ ලෙස දැක්විය හැකිය.

දේශීය වශයෙන් වන සීමාවන් ප්‍රවේශම් සහිතව ලිහිල්කර සේවා අංශයේ ආයතන ශක්තිමත් කරන්නේ නම් ශ්‍රී ලංකාවෙහි සේවා අපනයන වේගයෙන් වර්ධනය කිරීමට හැකියාවක් ඇත. සේවා වෙළෙඳමේ යාන්ත්‍රණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම නිසා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වශයෙන් වාසි දයකව පවතින අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි සේවා දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම සහ අපනයනය කිරීම අනවශ්‍ය පරිදි සීමා කර ඇත. ඒ සමගම සේවා වෙළෙඳමේ 2 වන ක්‍රමය යටතේ එම සේවා ආනයනයන් දිරිමත් කර ඇත. සමහර වෘත්තීය සේවාවන් සඳහා තවමත් ගුණාත්මක ප්‍රමිති මැනීමේ ක්‍රම ප්‍රමාණවත් මට්ටමකට දියුණු කර නොමැත. එබැවින්, ශීඝ්‍රයෙන් ව්‍යාප්තවන සේවා වෙළෙඳමෙන් ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලැබීමට නම් පවතින බාධාවන් ඉවත්කරමින් ආයතනික ව්‍යුහය වඩාත් වැඩිදියුණු කිරීම අවශ්‍ය වනු ඇත.

විවිධ ආයෝජන සහ රජය වෙත ලැබුණු ණය සහ දීමනාවල සිදු වූ වර්ධනය තුළින් මූල්‍යනය විය. විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම තුළින් ඉතිරිකිරීම් හා ආයෝජන අතර ඇති පරතරය පියවීම සඳහා විදේශ ණය මත රඳා පැවතීම අඩු කළ හැකිවනු ඇත.

- **වෙළෙඳපොළට ප්‍රවිෂ්ට වීම සඳහා රජය මෙන්ම පෞද්ගලික ව්‍යවසායකයින් විසින් දරණ ලද සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර තරගකාරීත්වයට මුහුණ දීමට ශ්‍රී ලංකාවට හැකි විය.** 2005 වසරේදී සමස්ත අපනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6,347 දක්වා සියයට 10.2 කින් වර්ධනය වූ අතර, සමස්ත ආනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8,863 දක්වා සියයට 10.8 කින් වර්ධනය විය. සමස්ත අපනයනයන්ගෙන් සියයට 78 ක් වූ කාර්මික අපනයන 2005 වසරේදී අපනයන වර්ධනයට සියයට 75 කින් දයක විය. සමස්ත අපනයනයන්ගෙන් සියයට 18 ක් වූ කෘෂිකාර්මික අපනයන, සමස්ත අපනයන වර්ධනයට සියයට 15 කින් දයක විය. මේ අතර, ඛනිජ සහ අනෙකුත් අපනයන සමස්ත අපනයන වලින් සියයට 4 ක් නියෝජනය කළ අතර, අපනයන වර්ධනයෙන් සියයට 10 කට දයකත්වය සැපයීය. විනිමය අනුපාතිකය අධිප්‍රමාණය වීම, පවත්නා අඩු පොලී අනුපාතික, සහ විශේෂයෙන් අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන ඉල්ලුම ඉහළ යාමට හේතු වූ සුනාමි ව්‍යසනයට ලක් වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ කටයුතු යනාදිය රටෙහි ආර්ථික කටයුතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් දයක විය.

- **ඓතිහාසිකව ඉහළ මට්ටමක පැවති තෙල් මිල ගණන්. 2005 දී රටේ ආනයන වියදම් මූල්‍යනය කිරීමෙහි ලා ඉතා අයහපත්කාරී බලපෑමක් ඇති කළේය.** 2005 දී ඛනිජ තෙල් ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,655 දක්වා සියයට 37 කින් ඉහළ ගියේය. මෙම වියදමෙහි වැඩිවීම මිලෙහි ඉහළ යාමට සමානුපාතික විය. පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල්වල දේශීය ඛනිජ තෙල් මිල ගණන් පිළිවෙළින් සියයට 18, 19 හා 20 බැගින් විදේශීය මිල වැඩිවීමෙන් කොටසක් පමණක් නියෝජනය වන ලෙස ඉහළ නැංවිණි. මෙසේ දේශීය මිල ගණන් ගැලපීම නිසා දේශීය තෙල් පරිභෝජනයේ අවශ්‍ය ගැලපීම් නිසි අයුරින් සිදු වී නොවිණි. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් වැඩි වශයෙන් භාවිතා කරනුයේ ප්‍රවාහන අංශය (සියයට 50) වන අතර, දෙවනුව විදුලිබලය උත්පාදනය (සියයට 25) සඳහාය. ඉතිරිය (සියයට 25) කර්මාන්ත, කුටුම්බ හා අනෙකුත් අංශ විසින් භාවිතා කරනු ලැබේ. ඛනිජ තෙල් පිරිවැය සත්‍ය වශයෙන් පිළිබිඹු වන ආකාරයට මගී ප්‍රවාහන හා විදුලිය ගාස්තුවල සම්පූර්ණ ගැලපීම් නොකරන ලද හෙයින් එය රජයේ අයවැයට හා ඒ හා සම්බන්ධිත රාජ්‍ය සංස්ථාවල පැවැත්මටද අයහපත් බලපෑම් ඇති විණි.

- **රජයේ ප්‍රාග්ධන ලැබීම් ඉහළයාම සහ පෞද්ගලික ප්‍රේෂණ ලැබීම්වල වර්ධනය හේතුවෙන් විදේශීය මූල්‍ය තත්ත්වය යහපත් වූ අතර, එය ගෙවුම් තුලනයේ අතිරික්තයක් ඇතිවීමට සහ රුපියලේ අගය අධිප්‍රමාණය වීමට ද හේතු විය.** වෙළෙඳ ශේෂය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,516 ක් දක්වා පුළුල් වුවද, ජංගම ගිණුමේ ශේෂය පුළුල් වූයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 650 කින් පමණි. මෙම සුභදයක තත්ත්වයට හේතු වූයේ විදේශීය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,918 ක් දක්වා සියයට 22.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීමයි. 2004 වර්ෂයේදී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 3.2 ක් වූ ජංගම ගිණුමේ හිඟය 2005 වර්ෂයේදී සියයට 2.8 දක්වා පහත වැටිණි. සුනාමි ව්‍යසනය වෙනුවෙන් මූල්‍ය ලැබීම්

නිසා 2005 වසර තුළ රජයේ ශුද්ධ ලැබීම් සියයට 51.0 කින් ඉහළයාම සහ ණය ආපසු ගෙවීම් කල් දැමීම නිසා අඩු මට්ටමක වූ ණය ආපසු ගෙවීම් වැනි හේතූන්ද ගෙවුම් තුලනයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 501 ක අතිරික්තයක් වාර්තා කිරීමට දායක විය. ඒ අනුව දළ නිල විදේශීය සංචිත (Gross Official Reserves) එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,735 දක්වා (මාස 3.7 ක ආනයන සඳහා ප්‍රමාණවත් පරිදි) වර්ධනය විය. මීට අමතරව, ණය සේවා ගෙවීම්හි ධාරිතාවය වර්ධනය වීම සහ ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය අධිප්‍රමාණය වීම සිදු විය.

- **ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන 2 කින් මගින් ශ්‍රී ලංකාව ප්‍රථම වරට 2005 වර්ෂයේදී, ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් ලබා ගත්තේය.** ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය ශ්‍රී ලංකාවට බීබී -(BB-) ශ්‍රේණිගත කිරීම ලබාදුන් අතර, ස්ටෑන්ඩර්ඩ් සහ පුවර් ශ්‍රේණිගත සේවාව මගින් බී +(B+) ශ්‍රේණිගත කිරීම් ලබා දී ඇත. මෙම ශ්‍රේණිගත කිරීම් රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයන්ටද ජාත්‍යන්තර වෙළෙඳපොළවල් හරහා මූල්‍ය සම්පත් ලබා ගැනීමට උපකාරී වේ.

- **2005 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අනපේක්ෂිත සුනාමි ව්‍යසනයෙන් පසු ආර්ථිකය වේගවත්ව යළි යථා තත්ත්වයට පත් කිරීමට සහාය වෙමින් සහ දිගුකාලීනව ශක්තිමත් රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් කරා ළඟාවෙමින් දිළිඳු ජනතාව කෙරෙහි සහ ආර්ථික වර්ධනය කෙරෙහි යොමුවන සංවර්ධනයක් අරමුණු කරගෙන ක්‍රියාත්මක විය.** සුනාමි ව්‍යසනයෙන් පසු ආර්ථිකය නැවත ගොඩ නැංවීමේ ක්‍රියාවලියට මැදිහත්වීමට සිදුවීම සහ ජාත්‍යන්තර තෙල් මිල ගණන් ඉහළ යාමෙන් ඇති වූ බලපෑම්වලට මුහුණ දීමට සිදුවීම නිසා 2005 වර්ෂයේ දී සමස්ත රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අභියෝගාත්මක කාර්යයක් විය. මෙය ඉටුකර ගැනීමට සිදු වූයේ ඉහළ යන පොලී අනුපාතික සහ දැනටමත් ඉහළ මට්ටමක පැවති ණය ආපසු ගෙවීමේ වාතාවරණයක් තුළය. සුනාමි ව්‍යසනයෙන් යථා තත්ත්වයට පත්වීමට තිබූ හදිසි අවශ්‍යතාවය මෙන්ම ඉහළ තෙල් මිල මගින් ඇති වූ අයහපත් බලපෑම නිසා ප්‍රතිපත්ති ස්ථාවරය ප්‍රසාරණාත්මක තත්ත්වයක පැවතිණි. සුනාමි ව්‍යසනයෙන් පසු රට යළි ගොඩනැංවීමේ ක්‍රියාවලිය සඳහා රජයේ උත්සාහයන්ට අමතරව පෞද්ගලික අංශයෙන් සහ ආධාර සපයන රටවලින් ද සහාය ලැබිණි.

- **2005 වසරේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ යම් හිතකර සංවර්ධනයන් දක්නට ලැබිණි.** 2005 සංශෝධිත ඇස්තමේන්තුවලින් අපේක්ෂා කළ පරිදි රාජ්‍ය ආදායම් 2004 වසරේදී සියයට 15.4 ක සිට 2005 වසරේදී සියයට 16.1 ක් දක්වා වර්ධනය විය. පෙර වසරේ සියයට 13.9 ක් වූ බදු ආදායම ද සියයට 14.2 ක් දක්වා වර්ධනය විය. සුනාමි වියදම් ද ඇතුලත්ව 2005 වසරේ මුළු වියදම හා ශුද්ධ ණයදීම් ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 24.7 ක්වූ අතර,


### 1.3 සංඛ්‍යා සටහන
### විදේශීය අංශයේ සංවර්ධනයන්

| | එ.ජ.ඩො. දශ ලක්ෂ | | වර්ධනය % |
|---|---|---|---|
| | 2004 | 2005 | |
| **අපනයන** | **5,757** | **6,347** | **10.2** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 1,065 | 1,154 | 8.3 |
| කාර්මික නිෂ්පාදන | 4,506 | 4,948 | 9.8 |
| ඛණිජමය අපනයන | 120 | 143 | 19.5 |
| වෙනත් අපනයන | 66 | 101 | 53.3 |
| **ආනයන** | **8,000** | **8,864** | **10.8** |
| පාරිභෝගික භාණ්ඩ | 1,623 | 1,644 | 1.3 |
| අතරමැදි භාණ්ඩ | 4,645 | 5,317 | 14.5 |
| ආයෝජන භාණ්ඩ | 1,670 | 1,870 | 12.0 |
| වෙනත් | 61 | 33 | -46.0 |
| **වෙළෙඳ ශේෂය** | **-2,243** | **-2,517** | **12.3** |
| **සේවා, ශුද්ධ** | **419** | **338** | **-19.3** |
| ලැබීම් | 1,527 | 1,540 | 0.9 |
| ගෙවීම් | 1,108 | 1,202 | 8.5 |
| **ආදායම්, ශුද්ධ** | **-203** | **-299** | **47.3** |
| ලැබීම් | 157 | 35 | -77.7 |
| ගෙවීම් | 360 | 335 | -6.9 |
| **පෞද්ගලික ජංගම සංක්‍රාම, ශුද්ධ** | **1,380** | **1,828** | **32.5** |
| **පෞද්ගලික සංක්‍රාම, ශුද්ධ** | 1,350 | 1,736 | 28.6 |
| ලැබීම් | 1,564 | 1,968 | 25.8 |
| ගෙවීම් | 214 | 233 | 8.8 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-647** | **-650** | **0.5** |
| **ප්‍රාග්ධන ගිණුම** | **64** | **250** | **289.0** |
| **මූල්‍ය ගිණුම** | **567** | **974** | **71.8** |
| සෘජු ආයෝජන, ශුද්ධ | 227 | 234 | 2.9 |
| ලැබීම් | 233 | 272 | 16.7 |
| ගෙවීම් | 6 | 38 | 564.4 |
| පෞද්ගලික දිගුකාලීන, ශුද්ධ | 14 | 11 | -21.0 |
| ලැබීම් | 169 | 197 | 16.6 |
| ගෙවීම් | 155 | 186 | 20.0 |
| රාජ්‍ය දිගුකාලීන, ශුද්ධ | 440 | 553 | 25.8 |
| ලැබීම් | 771 | 747 | -3.1 |
| සුනාමි සම්බන්ධ ලැබීම් | | 93 | |
| ගෙවීම් | 331 | 194 | -41.5 |
| කෙටිකාලීන | -112 | 176 | -256.6 |
| විවිධ ආයෝජන ශුද්ධ | 11 | 60 | 451.4 |
| වැරදීම් සහ අත්හැරීම් | -189 | -72 | |
| **සමස්ත ශේෂය** | **-205** | **501** | |
| **දළ නිල වත්කම්** | 2,195.8 | 2,735.1 | |
| ආනයන මාස ගණන | 3.3 | 3.7 | |
| **මුළු විදේශ වත්කම්** | 3,438.5 | 4,200.6 | |
| ආනයන මාස ගණන | 5.2 | 5.7 | |
| **ණය ආපසු ගෙවීමේ දී ලැබූ සහන** | | 264.0 | |
| අපනයන මිල දර්ශකය | 95.7 | 98.9 | |
| ආනයන මිල දර්ශකය | 91.7 | 98.9 | |
| වෙළෙඳ අනුපාතිකය | 104.4 | 100.0 | |
| **විනිමය අනුපාත (සාමාන්‍ය)** | | | අධිප්‍රමාණ(+) /අවප්‍රමාණ(-) |
| රුපියල්/එ.ජ. ඩොලර් | 101.19 | 100.50 | 0.7 |
| රුපියල්/යෙන් | 0.94 | 0.91 | 3.3 |
| රුපියල්/යුරෝ | 125.79 | 125.10 | 0.6 |
| රුපියල්/එ.රා.පවුම් | 185.35 | 182.87 | 1.4 |


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

එය 2005 වසරේ සංශෝධිත ඇස්තමේන්තුවලින් අපේක්ෂා කළ අගයට සමාන විය. මෙයට හේතු වූයේ රජයේ වර්තන වියදම් 2005 සංශෝධිත ඉලක්කය වූ සියයට 18.4 හා සැසඳීමේදී සියයට 18.7 දක්වා වැඩි වීමයි. 2004 වසරේ ද.දේ.නි.යෙන් සියයට 4.8 ක් වූ රාජ්‍ය සංස්ථාවලට ලබාදුන් ණයද ඇතුළත් රාජ්‍ය ආයෝජන 2005 වසරේ සියයට 6.3 ක් දක්වා ඉහළ ගියේය. 2005 වසරේ රජයේ සමස්ත අයවැය හිඟය, එහි අපේක්ෂිත මට්ටම වූ ද.දේ.නි.යෙන් සියයට 8.2 හා සැසඳීමේදී සියයට 8.7 දක්වා ඉහළ ගියේය. 2005 වසරේ සුනාමි වියදම් ඉවත් කළ පසු අපේක්ෂිත අයවැය හිඟය ද ද.දේ.නි.යෙන් සියයට 6.8 ක් වූ

**1.5 රූප සටහන**
**රාජ්‍ය ආදායම, වියදම සහ අයවැය හිඟය**




**1.6 රූප සටහන**
**රාජ්‍ය ණය**




අපේක්ෂිත මට්ටම හා සැසඳීමේදී සියයට 7.3 ක් දක්වා වැඩි විය. මෙම අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා දේශීය සම්පත් (ද.දේ.නි.යෙන් සියයට 5.2) සහ විදේශීය සම්පත් (ද.දේ.නි. යෙන් සියයට 3.5) ද භාවිතා කෙරිණි.

- **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2004 වසරේ සියයට 105.5 ක් වූ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2005 වසරේ සියයට 93.9 ක් දක්වා අඩු විය. මීට හේතු වූයේ නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධනය හා ප්‍රධාන විදේශ මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අධි ප්‍රමාණය වීමයි.** 2005 වසරේදී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය ණය ප්‍රමාණය අඩු වූ නමුදු රාජ්‍ය ණය ප්‍රමාණය තවමත් ඉහළ මට්ටමක පවතී. 2005 වසරේදී මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 82.8 කින් රුපියල් බිලියන 2,222.3 දක්වා ඉහළ ගියේය. මෙම තත්ත්වය නිසා කෙමෙන් වැඩිවන පොලී ගෙවීම්, හේතුවෙන් මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වලට අමතරව බාහිර කම්පනයන්ට ඔරොත්තුදීමේ ඇති හැකියාවට ද අහිතකර බලපෑම් ඇති වේ. මේ නිසා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තවදුරටත් ශක්තිමත් කර රාජ්‍ය ණය අඩු කරමින් රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය මැදිකාලයේ සිට දිගුකාලය දක්වා ශක්තිමත් කිරීම සඳහා උචිත ක්‍රියා මාර්ග ගත යුතුව ඇත.

- **2004 වසරේ ඇරඹි මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම 2005 වසර තුළදී ද තවදුරටත් පවත්වාගෙන යන ලදී. මෙහි අරමුණු වූයේ උද්ධමන පීඩනය අඩු කිරීම, මුදල් සමස්තයන්ගේ ඉහළ වර්ධනය අඩු කිරීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමයි.** සුනාමි ව්‍යසනය නිසා 2005 දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තාවකාලිකව වෙනස් කිරීමට ද සිදු විය. සුනාමි ව්‍යසනය ඇතිවීමත් සමඟ මුදල් වෙළෙඳපොළවල සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමේ අරමුණින් 2005 ජනවාරි මස මුල් භාගයේ සිට විවට වෙළෙඳ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. කෙසේ වුවද, සුනාමි ව්‍යසනය නිසා මූල්‍ය අංශය සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වූ තර්ජනය ක්‍රමයෙන් පහව යාමත් සමඟ 2005 පෙබරවාරි මස අවසාන භාගයේ සිට විවට වෙළෙඳ කටයුතු නැවතත් උද්ධමනාත්මක පීඩනය අඩු කිරීම සඳහා දැඩි ලෙස ක්‍රියාත්මක විය. විවට වෙළෙඳ කටයුතු දැඩි කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමට දරනු ලැබූ ප්‍රයත්නයට සංචිත මුදල් වර්ධනය පාලනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග මගින් තවදුරටත් අනුබල ලැබිණි. ඒ අනුව සංචිත මුදල් ආර්ථිකයට ගලා යාම අවම කිරීම උදෙසා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසියේදී මිලදී ගැනීමෙන් හැකි තරම් වැළකී සිටීම, ස්ථිර පදනමක් මත වෙළෙඳපොළ ද්‍රවශීලතාවය අවශෝෂණය කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළෙඳපොළේ විකිණීම සහ මහ බැංකු ප්‍රතිපත්තිමය පොලී අනුපාතික වන ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික 2005 වසරේ මැයි මාසයේදී පදනම් අංක 25 කින්ද, ජූනි මාසයේදී පදනම් අංක 50 කින්ද, සැප්තැම්බර් මාසයේදී පදනම් අංක 25 කින්ද සහ දෙසැම්බර් මාසයේදී තවදුරටත් පදනම් අංක 25 කින්ද වශයෙන් අවස්ථා හතරකදී වැඩි කිරීම ද සිදු විය.

- **මුදල් සැපයුමෙහි ප්‍රසාරණ වේගය අඩුවීම. උද්ධමන වේගය අඩුවීම සහ උද්ධමනකාරී අපේක්ෂාවන් අඩුවීම තුළින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ගවලට ආර්ථිකය හොඳින් ප්‍රතිචාර දැක්වූ බව පිළිබිඹු විය.** 2005 දෙසැම්බර් මස අවසානය වනවිට සංචිත මුදල් වර්ධන වේගය ඉලක්කගත වර්ධන මට්ටම දක්වා අඩු විය. පුළුල් මුදල් වර්ධන වේගය ද අඩු වූ නමුත් එය තවමත් ඉහළ මට්ටමක පවතී. විදේශීය අංශයෙහි පැවති ඉහළ ස්ථාවරත්වය ද මූල්‍ය මෙහෙයුම් කටයුතු සඳහා සහ මුදල් ප්‍රතිපත්ති අරමුණු කරා ළඟාවීම සඳහා උපකාරී විය. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම, විනිමය අනුපාතිකයෙහි පැවති ස්ථායීතාවය සහ සමස්ත සැපයුමේ සතුටුදායක වර්ධනය හේතුවෙන් 2005 වසර මුල් අවධියේ ඉහළ මට්ටමක පැවති උද්ධමන වේගය වසර අවසාන වනවිට අඩු විය. එමෙන්ම, උද්ධමන අපේක්ෂාවන්හි අඩුවීම පිළිබිඹු කරමින් රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළේ එලද අනුපාතික සහ ඉදිරි විදේශීය විනිමය වෙළෙඳපොළෙහි අධිමිලද අඩු විය.

- **2005 වසරේ මූල්‍ය අංශය වර්ධනය වීමත් සමඟ එහි ස්ථායීතාවය සහ ඔරොත්තුදීමේ ශක්තිය ද වැඩි විය.**


ලාභදායිත්වය, ශක්තිමත්භාවය සහ සපයන ලද මූල්‍ය උපකරණ හා සේවාවන්ගේ වර්ධනය යන අංශයන් සලකා බලන කල, මූල්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය තවදුරටත් වර්ධනය වී ඇත. මූල්‍ය ආයතන විසින් නව පහසුකම් ලබා දීමට අමතරව විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා පහසුකම් සැලසීම පිණිස නව ආයතනයක් පිහිටුවීම තුළින් මූල්‍ය පහසුකම් සඳහා ඇති ඉඩ ප්‍රස්ථා තවදුරටත් වර්ධනය විය. ආර්ථික වර්ධනය පිළිබඳ විශ්වසනීයත්වය වැඩිවීම හේතුවෙන් මූල්‍ය වෙළෙඳපොළ කටයුතු වාර්තාගත අන්දමින් ඉහළ නැගුණි. මෙය විශේෂයෙන්ම විදේශ විනිමය සහ කොටස් වෙළෙඳපොළ කටයුතු වලින් පිළිබිඹු විය.

- **මූල්‍ය ක්‍රමයේ ස්ථාවරත්වය උදෙසා 2005 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියා මාර්ග කිහිපයක් ගත්තා ලදී**. ගෙවීම් හා පියවීම් පද්ධතීන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ගත් ක්‍රියා මාර්ග මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීම සඳහා නව නීතිරීති හඳුන්වාදීම සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූල වන ලෙස නීතිමය හා අධීක්ෂණ රාමුව වැඩි දියුණු කිරීම තුළින් මූල්‍ය අංශයේ යටිතල පහසුකම් තවදුරටත් වර්ධනය විය. 2005 සැප්තැම්බර් මස නීතිගත කරන ලද අංක 28 දරන ගෙවීම් හා පියවීම් පද්ධති පනත තුළින් ගෙවීම් හා පියවීම් පද්ධතිය අධීක්ෂණය කිරීමේ හැකියාව ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණි. මීට අමතරව, බැංකු නීති පනතට කරන ලද සංශෝධනයන් මගින් වංචනික පිරමීඩ ක්‍රම තහනම් කෙරිණි. තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) සහ නිර්ලේඛන සුරැකුම් පියවුම් පද්ධතියේ (SSS) කාර්යක්ෂමතාව වර්ධනය කරන ලද අතර, මෙම පද්ධතීන් සඳහා ප්‍රවිෂ්ටවීම් පුළුල් කරන ලදී. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාෂණ ක්‍රමය (Cheque Clearing and Truncation) 2006 වසරේ ස්ථාපිත කිරීමට නියමිතය. මූල්‍ය ආයතනවල ප්‍රාග්ධන අවශ්‍යතාවය වැඩිකරන ලද අතර, තනි පුද්ගල ණය සීමාව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ තොරතුරු හෙළිදරව් කිරීම ආදියට අදාළව නව නියාමනයන් පනවන ලදී. 2007/08 වන විට බාසල් II ප්‍රාග්ධන ගිවිසුමට අනුකූල ලෙස කටයුතු කරන ලෙස බැංකුවලට දැනුම් දී ඇත. මූල්‍ය ආයතනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තෝරා ගැනීම පිළිබඳව මනා හා උචිත නිර්ණායක තවදුරටත් ශක්තිමත් කරන ලදී. ලියාපදිංචි නොකළ හා ව්‍යාජ මූල්‍ය ආයතනයන්හි අරමුදල් ආයෝජනය කිරීමේ අවදානම පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මූල්‍ය ක්‍රමයේ ස්ථාවරත්වය පිළිබඳව මහජනයා දැනුවත් කිරීම හා ඒ පිළිබඳව විශ්වාසය වර්ධනය කිරීම අරමුණු කරගෙන මූල්‍ය ස්ථාවරත්ව විවරණය පිළිබඳ දෙවන වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2005 වසරේදී නිකුත් කරන ලදී.

- **මූල්‍ය අතරමැදිකරණ පිරිවැය. විශාල මූල්‍ය සමූහායතන අධීක්ෂණය සහ සමායතන පාලනය වර්ධනය කිරීම යනාදියට අදළ ගැටලු විසඳීම තුළින් මූල්‍ය ක්‍රමයට කම්පනවලට ඔරොත්තු දීමේ ශක්තිය වැඩිවන අතර එහි ස්ථායීතාවය තවදුරටත් වර්ධනය වීමට එය ඉවහල් වනු ඇත**. පොලී අනුපාතික පරතරය මගින් නියෝජනය වන බැංකුවල මූල්‍ය අතරමැදිකරණ පිරිවැය මෑත කාලයේදී පහත වැටී තිබුණ ද, කලාපීය රටවල් හා සසඳනවිට එය තවමත් ඉහළ මට්ටමක පවතී. ඉහළ අතරමැදිකරණ පිරිවැය අඩු කිරීම සඳහා කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය දියුණු කිරීමට අවශ්‍ය පියවර බැංකු විසින් ගත යුතුව ඇත. මූල්‍ය ආයතනවල කොටස් හිමිකාරත්වයෙහි සංකේන්ද්‍රණයවීම හා සම්බන්ධයෙන් මෑතදී පැන නැඟුණු ගැටළු මහජන හා ආයෝජන විශ්වාසය පලුදු කරන බැවින් මූල්‍ය ආයතනවල යහ පාලනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. විශාල මූල්‍ය සමූහායතනවලට අයත් උප සමාගම් එම එකිනෙක ආයතන අතර කොටස් හිමිකාරත්වයන් පවත්වා ගැනීමත් එයින් අයිතිවාසිකම් පිළිබඳ ගැටීම් ඇතිවීමත් තුළින්, මෙම තත්ත්වය පෙන්නුම් කෙරේ. බැංකු


**1.7 රූප සටහන**

**සංචිත මුදල් සහ පුළුල් මුදල් වර්ධනය**




**1.8 රූප සටහන**

**පොලී අනුපාතිකයන්හි වෙනස්වීම්**



පනතේ විධිවිධාන වඩාත් දැඩිව බලගැන්වීම තුළින් හා වැඩි ප්‍රමාණයක තොරතුරු හෙළිදරව් කිරීමට සැලැස්වීම යනාදිය මගින් වෙළෙඳපොළ විනය පවත්වා ගැනීමටත් ඒ මගින් යහ පාලනය වර්ධනය කිරීමටත් අවශ්‍ය මූලික පියවර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇත.

## 1.2 විදේශීය ආර්ථික වාතාවරණය

- **ලෝක ආර්ථිකයේ අඛණ්ඩ වර්ධනය සහ පහළ මට්ටමක පැවැති උද්ධමන තත්ත්වය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට හිතකර විදේශීය ආර්ථික වාතාවරණයක් ඇති කළේය.** ජාත්‍යන්තර තෙල් මිල ගණන් නොකඩවා ඉහළයාම සහ නිරන්තරයෙන් ස්වාභාවික ව්‍යසනයන් පැවතුණ තත්ත්වයක් යටතේ වුවද, 2005 වර්ෂයේදී ලෝක දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.8 කින් වර්ධනය විය. මෙය 2004 වර්ෂයේදී පැවැති දශක කිහිපයක් තුළ වූ ඉහළම වර්ධනය වූ සියයට 5.3 ක වර්ධනයට පසුව පැවති වර්ධනය විය. ගෝලීය ආර්ථික වර්ධනය පහත වැටීම පිළිබිඹු කරමින්, ගෝලීය වෙළෙඳ පරිමාවේ වර්ධනය 2004 වර්ෂයේදී සියයට 10.4 ක් වූ අතර, එය 2005 වර්ෂයේදී සියයට 7.3 දක්වා පහත වැටුණි. ඉහළ තෙල් මිලට ප්‍රතිචාර දක්වමින් 2005 වසරේදී ලෝක උද්ධමනය ආන්තික වශයෙන් ඉහළ ගියේය. නමුත් යටිදරි උද්ධමනය ස්ථාවරව පැවැතුණු අතර, බොහෝ ආර්ථිකයන් ප්‍රසාරණාත්මක මුදල් ප්‍රතිපත්තීන්ගෙන් ක්‍රමයෙන් ඉවත්වීම නිසා උද්ධමන අපේක්ෂාවන් අඩු මට්ටමක පැවතිණි. ලෝක ආර්ථික වර්ධනය සම්බන්ධ අනාගත අපේක්ෂාවන් හිතකර තත්ත්වයක පවතින අතර, 2006 වසරේදී ලෝක දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.9 කින් පමණ 2005 වසරට වඩා මඳ වශයෙන් වැඩි වේගයකින් වර්ධනය වේ යැයි බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, ගෝලීය ආර්ථිකයේ අපේක්ෂිත ඉදිරි දැක්ම සඳහා බලපාන අවදානම් රැසක් ඇත. ඉහළ මට්ටමක පවත්නා සහ විචලනය වන තෙල් මිල ගණන් සහ එමගින් මිල මට්ටම් සඳහා ඇතිවන බලපෑම වර්තමානයේ යටිදරි උද්ධමනයෙහි පවත්නා ස්ථායීතාවයට තර්ජනයක් වනු ඇත. කුරුලු උණ (bird flue) රෝගය දැඩි මානව සහ ආර්ථික පිරිවැයක් ගෙන දෙන වසංගතයක් වීමට ඉඩ ඇත. ලෝක ආර්ථිකයේ වැඩි වන අසමතුලිත තත්ත්වයන්, විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ ජංගම ගිණුමේ විශාල හිඟය සහ වර්ධනය වන විදේශීය ණයගැති භාවය මූල්‍යනය කිරීමට අපොහොසත් වුවහොත් අනිසි ගැලපුම් තුළින් සිදුවිය හැකි අවදානම පවතී.

- **ශ්‍රී ලංකාව භාණ්ඩ හා සේවා අපනයන කටයුතු කරන ප්‍රධාන රටවල ආර්ථික වර්ධනය යහපත් තත්ත්වයක පවතී.** **ඇමෙරිකා එක්සත් ජනපදයේ අපේක්ෂිත ආර්ථික වර්ධනය අඩු විය හැකි වුවද. එය තවමත් අනෙකුත් කාර්මික රටවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.** ජපානයේ අවධමනාත්මක පීඩනය අඩු වෙමින් ආර්ථික කටයුතු වේගයෙන් වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. 2005 වර්ෂයේදී යුරෝ කලාපයේ දුර්වල ක්‍රියාකාරිත්වයක් පැවතියද, 2005 වසරේ 4 වන කාර්තුවේ සිට ආර්ථික කටයුතු ප්‍රසාරණය වීමක් පෙන්නුම් කර ඇත. නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි සහ සංවර්ධනය වන රටවල ආර්ථික වර්ධනය 2004 වර්ෂයේදී සියයට 7.6 ක සිට 2005 වර්ෂයේදී සියයට 7.2 දක්වා ආන්තික වශයෙන් පහළ ගිය ද, එම ආර්ථිකයන්හි වර්ධනය ද ශක්තිමත්ව පැවතුණි. වැඩිවෙන තෙල් මිල, ලෝක ආර්ථික වර්ධනය පහත වැටීම සහ රටවල්වලට විශේෂිතව බලපෑ සාධක ආර්ථික වර්ධනය ආන්තික වශයෙන් පහත වැටීමට හේතු විය. ආසියාවේ නැගී එන ආර්ථිකයන් වන ඉන්දියාවේ සහ චීනයේ ඉහළ දේශීය හා විදේශීය ඉල්ලුම හේතුවෙන් අපේක්ෂිත ආර්ථික වර්ධනයට වඩා ඉහළ වර්ධනයක් අඛණ්ඩව අත්කර ගෙන ඇත. මැද පෙරදිග රටවල් සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය ස්වාධීන රාජ්‍යයන් වැඩිවෙන තෙල් මිල හේතුවෙන් ප්‍රතිලාභ අත්කර ගත්හ. එමෙන්ම, නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආර්ථික කටයුතුවල පහත වැටීමේ ලකුණු පෙන්නුම් නොකරයි.

**1.4 සංඛ්‍යා සටහන**

**ගෝලීය ආර්ථික ප්‍රවනතාවයන් සහ ඉදිරි දැක්ම**
**(වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස)**

| ශීර්ෂය | ප්‍රත්‍යක්ෂ අගයයන් | | පුරෝකථන | |
|---|---|---|---|---|
| | 2004 | 2005 | 2006 | 2007 |
| **ලෝක නිෂ්පාදිතය** | 5.3 | 4.8 | 4.9 | 4.7 |
| සංවර්ධිත ආර්ථිකයන් | 3.3 | 2.7 | 3.0 | 2.8 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 4.2 | 3.5 | 3.4 | 3.3 |
| යුරෝ කලාපය | 2.1 | 1.3 | 2.0 | 1.9 |
| එක්සත් රාජධානිය | 3.1 | 1.8 | 2.5 | 2.7 |
| ජපානය | 2.3 | 2.7 | 2.8 | 2.1 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 7.6 | 7.2 | 6.9 | 6.6 |
| සංවර්ධනය වන ආසියාව | 8.8 | 8.6 | 8.2 | 8.0 |
| චීනය | 10.1 | 9.9 | 9.5 | 9.0 |
| ඉන්දියාව | 8.1 | 8.3 | 7.3 | 7.0 |
| **ලෝක වෙළෙඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **10.4** | **7.3** | **8.0** | **7.5** |
| ආනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 8.9 | 5.8 | 6.2 | 5.6 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 15.8 | 12.4 | 12.9 | 11.9 |
| අපනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 8.5 | 5.3 | 6.6 | 6.1 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 14.6 | 11.5 | 10.9 | 10.3 |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 2.0 | 2.3 | 2.3 | 2.1 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 5.7 | 5.4 | 5.4 | 4.8 |
| භාණ්ඩ මිල | | | | |
| ඉන්ධන | 30.7 | 41.3 | 14.8 | 2.9 |
| ඉන්ධන නොවන | 18.5 | 10.3 | 10.2 | -5.5 |
| **සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (ප්‍රතිශතය)** | | | | |
| එක්සත් ජනපද ඩොලර් තැන්පතු සඳහා | 1.8 | 3.8 | 5.0 | 5.1 |

මූලය : World Economic Outlook (2006 අප්‍රේල්) ජා.මූ.අ.

- **පොදු ජාත්‍යන්තර නීති පද්ධතියක් තුළ වෙළෙඳම ක්‍රියාත්මක කරවීමේ උත්සාහය තවදුරටත් පැවැති අතර. ශ්‍රී ලංකාව බහුපාර්ශ්වීය. කලාපීය හා ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් මගින් 2005 දී තවදුරටත් වෙළෙඳ අවස්ථා පුළුල් කර ගත්තේය**. ලෝක වෙළෙඳ සංවිධානයේ ආරම්භක සාමාජිකයෙක් වූ ශ්‍රී ලංකාව, බහුපාර්ශ්වීය වෙළෙඳ ක්‍රමයකට දැඩි ලෙස බැඳී සිටී. ලෝක වෙළෙඳ සංවිධානයේ හය වෙනි අමාත්‍ය මණ්ඩල සමුළුව 2005 වසර තුළ හොංකොංහිදී පැවැති අතර, දෝහා සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ තරමක වර්ධනයක් ලබා තිබුණි. මෙහිදී කෘෂිකාර්මික සහනාධාර ඉවත් කිරීම සහ ඌන සංවර්ධිත රටවලට අමතර සහනයන් සැලසීම සම්බන්ධයෙන් ඉමහත් ප්‍රගතියක් අත් කර ගත්තේය. කලාපීය වශයෙන් ගත් කළ, දකුණු ආසියාතික වරණීය වෙළෙඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුමක් (SAFTA) බවට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාව එකඟතාවය පළ කළේය. බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වයෙන් වූ (BIMST-EC) නිදහස් වෙළෙඳ ගිවිසුමක කෙටුම්පත සකස් කර අවසන් වීමත් සමඟ ශ්‍රී ලංකාව කලාපීය සහයෝගීතාව සම්බන්ධයෙන් තවත් පියවරක් ඉදිරියට තැබීය. දියුණු වෙමින් පවතින රටවල් අතර තීරු බදු වරණයන් ඔස්සේ වෙළෙඳාම ඉහළ නැංවීමේ පියවරක් ලෙස පිහිටුවනු ලැබූ වෙළෙඳ වරණයන් පිළිබඳ ගෝලීය ක්‍රමය (Global System of Trade Preferences) යටතේ ශ්‍රී ලංකාවට අනෙකුත් සාමාජික රටවලින් තවදුරටත් තීරු බදු සහනයන් ලබා ගැනීමට හැකි විය. ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර පැවති බහුපාර්ශ්වීය සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP +) යටතේ විශේෂ සහන ප්‍රදානයක් 2005 දී ලැබුව ද, එහි උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා තවදුරටත් සාකච්ඡා පැවැත්වීම අවශ්‍යව ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර යෝජිත විස්තීරණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) ඔස්සේ තවදුරටත් සාකච්ඡා පැවැත්විණි. ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර ඇති කරගත් නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ දෙරට විසින්ම අපේක්ෂා කළ තීරු බදු සහනයන් පිළිබඳ ගැටලු නිරාකරණය කිරීමත් සමඟ, 2005 ජුනි මාසයේ සිට වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වීම ආරම්භ විය. තායිලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය හා ඉරානය වැනි රටවල් අතර ද 2005 දී බහු පාර්ශ්වීය වෙළෙඳ සාකච්ඡා පැවැත්විණි. කෙසේ වෙතත්, වෙළෙඳාම තවදුරටත් විවෘත කිරීම හා එයින් අත්වන ආර්ථික ප්‍රතිලාභවල මධ්‍යකාලීන සහ දිගුකාලීන ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් දැනට ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන ආර්ථික සබඳතා යම්කිසි ආකාරයකට තාර්කීකරණය කිරීම ද වැදගත් වේ.

- **2005 වර්ෂය තුළ ලෝක මූල්‍ය වෙළෙඳපොළ යහපත් තත්ත්වයක පැවතිණි**. එක්සත් ජනපදයේ සහ යුරෝ කලාපය තුළ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් කෙටි කාලීන පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ ගිය ද, දිගුකාලීන ගෝලීය පොලී අනුපාතිතකයන් අඩු මට්ටමක පැවතිණි. නැගී එන වෙළෙඳපොළවල්හි සහ සංවර්ධිත රටවල සාංගමික අංශයෙහි ඉහළ මට්ටමක පැවති ශුද්ධ ඉතිරිකිරීම් සහ ඛනිජ තෙල් මත වූ ආදයම් ඉහළයාම ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවල්හි ද්‍රවශීලතාවය විශාල ලෙස වැඩි කිරීමට හේතු වූ අතර, එය දිගුකාලීන පොලී අනුපාතික ස්ථායීව පවත්වා ගැනීමට උපකාරී විය. එ.ජ.ඩොලරයට වාසිදයක වන ලෙස පැවති කෙටිකාලීන පොලී අනුපාතික අතර වෙනස, විදේශීය මුදල් ලැබීම් වැඩි කිරීමටත්, එ.ජ..ඩොලරය අධිප්‍රමාණය වීමටත් හේතු විය. එය ඇමෙරිකාවේ වර්ධනය වෙමින් පවත්නා ජංගම ගිනුමේ හිඟය කිසිදු අහිසි ගැලපීමකින් තොරව මූල්‍යනය කිරීමට උපකාරී විය. නැගී එන ආසියාව තුළ 2005 වර්ෂය තුළදී දක්නට ලැබුණු කැපී පෙනුන වර්ධනයක් වූයේ චීනයේ සහ මැලේසියාවේ ව්‍යවහාර මුදල් දිගු කාලයක් තුළ එ.ජ.ඩොලරයට සම්බන්ධ කර පැවති තත්ත්වයෙන් මිදී වඩාත් නම්‍යශීලි විනිමය අනුපාතික ක්‍රම හඳුන්වා දීමයි. ගෝලීය ජංගම ගිණුම් අසමතුලිතතාව තරමක් දුරට අඩු කිරීමට මෙය උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ගෝලීය අසමතුලිතතාවයන්හි නිසි ගැලපීමක් ඇතිවීම සඳහා මූල්‍ය අතිරික්ත පවත්නා ආසියානු සහ තෙල් නිෂ්පාදිත රටවල ව්‍යවහාර මුදල් එ.ජ.ඩොලරයට එරෙහිව තවදුරටත් අධිප්‍රමාණය වීම අවශ්‍ය වේ. බොහෝ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් ඔවුන්ගේ ණය අවශ්‍යතා මූල්‍යනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය පොලී අන්තරයන් සහිතව ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කළහ.

- **තෙල් මිල ඉහළ මට්ටමක පවතිනු ඇති අතර. එය තවදුරටත් ඉහළ යාම අවිනිශ්චිතය**. ගෝලීය ආර්ථික වර්ධනය, තෙල් භාවිතය, අඛණ්ඩව පවත්නා දේශපාලන අස්ථාවරභාවය සහ අතිරේක ධාරිතාවය සීමිතවීම යනාදිය තෙල් සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම සම්බන්ධව අස්ථායීතාවයක් ජනිත කර ඇත. ගෝලීය බල ශක්ති තත්ත්වයෙහි පවත්නා අස්ථායී බව නිසා ශ්‍රී ලංකාව සිය බල ශක්ති ප්‍රතිපත්තිය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය වේ. ජාත්‍යන්තර මිල වෙනස්වීම් පිළිබිඹු වන පරිදි බල ශක්ති මිල ගැලපීමේ ප්‍රතිපත්තියක් තුළින් තෙල් සහනාධාර සහ අධික තෙල් පරිභෝජනය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය මත ඇති වී තිබෙන අනවශ්‍ය පීඩනය අඩුකර ගත හැකි වනු ඇත. බලශක්ති නිෂ්පාදනය කරනු ලබන රාජ්‍ය අංශයේ ආයතනවල මූල්‍ය ශක්‍යතාවය සහතික කිරීමටත්, ඒ අනුව තරඟකාරී මිලකට බාධාවකින් තොරව බල ශක්තිය සැපයීමටත් හැකිවන ලෙස එම ආයතන ප්‍රතිසංස්කරණය කළ යුතුය.

**විශේෂ සටහන 3**

## සහනාධාරවල සුභසාධන වියදම

සහනාධාර යනු රජය විසින් පුද්ගලයින් (උදා: ගොවීන්), පෞද්ගලික ආයතන හා රාජ්‍ය ව්‍යවසායයන්ට වෙළෙඳපොළ මිල ගණන් වලට වඩා අඩු පිරිවැයකට භාණ්ඩයක් මිලදී ගැනීම, විකිණීම හෝ යම් සේවාවක් ලබාගැනීමට හැකිවන පරිදි ඔවුනට සහන සැලසීමට යොදාගන්නා ජනප්‍රිය මාර්ගයකි. සහනාධාර විවිධ මුහුණුවරින් යුක්තය; අයවැය මගින් සහනාධාර සඳහා අරමුදල් ලබාදීම, බදු නිදහස් හා බදු සහන ලබාදීම, භාණ්ඩ හා සේවා පිරිවැයට වඩා අඩුවෙන් සැපයීම හා මිල ක්‍රමය තුළින් සහනාධාර ඇතිකරනු ලබන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම ඒ අතර වේ.

සහනාධාර නිසා ඇතිවන සුභසාධන වියදම විවිධාකාරය. සහනාධාර නිසා රජයේ අයවැය කෙරෙහි බලපෑමක් ඇතිවන අතර, එම පිරිවැය ජනතාවගෙන් බදු අයකිරීම තුළින්, රජයේ ණය බර වැඩිකිරීම තුළින් හෝ බොහෝවිට රාජ්‍ය ආයෝජනය සඳහා වන වියදම් අඩුකිරීම හරහා රජයේ වියදම් අඩුකිරීම තුළින් දරා ගැනීමට සිදුවේ. එහෙයින්, සහනාධාර හේතුවෙන් ආර්ථික වර්ධනය හා සංවර්ධනයට අදාළව බරපතල ආවස්ථික පිරිවැයක් ඇතිවන අතර, පවත්නා සම්පත් ඵලදායී රාජ්‍ය ආයෝජනවලින් පුනරාවර්තන වියදම් දෙසට යොමුවීමක් සිදු වේ. තවද, බොහෝ විට පාරිභෝගිකයින් විසින් භාණ්ඩ හා සේවා සඳහා නිෂ්පාදන වියදමට වඩා අඩු මිලගණන් ගෙවීම හේතුවෙන් සම්පත් අධික ලෙස පරිභෝජනය කිරීමත් ඒවා අසමතුලිත ලෙස බෙදී යාමත් සිදුවේ. බොහෝ රටවල ජලය, විදුලිය හා ඛනිජතෙල් යනාදී උපයෝගිතා සේවාවන් සහනාධාරවලට යටත්කර ඇති අතර සම්පත් අධික ලෙස පරිභෝජනය කිරීමට එම තත්ත්වය හේතු වෙමින් පවතී. එවැනි අධිපරිභෝජනය හේතුවෙන් ලෝකය පුරා සම්පත් හිඟයක් ඇතිවිය හැකිය.

ශ්‍රී ලංකාවේ වාර්ෂික සහනාධාර ප්‍රධාන වශයෙන් ඛනිජතෙල් නිෂ්පාදන (රුපියල් බිලියන 26) හා පොහොර (රුපියල් බිලියන 6.8) යන අංශ තුළ දක්නට ලැබෙන අතර, 2005 දී එම සහනාධාර ප්‍රමාණය ද.දේ.නි. යෙන් සියයට 1.4 ක් පමණ විය. මෙම ප්‍රමාණය, 2005 වර්ෂයේ රජයේ සෞඛ්‍ය කටයුතු සඳහා වූ වියදම (රුපියල් බිලියන 44.8) හා නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදිකිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය (රුපියල් බිලියන 47.9) හා සැසඳිය හැකිය. එය දකුණු අධිවේගී මහාමාර්ගය ඉදි කිරීමට වැයවන මුළු ඇස්තමේන්තුගත වියදමට (රුපියල් බිලියන 33.9) බොහෝ දුරට සමානය. එම පිරිවැය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය පිහිටුවීම සඳහා 2005 දී වෙන් කරන ලද ප්‍රතිපාදනවලට වඩා (රුපියල් බිලියන 0.35) කිහිප ගුණයකින් වැඩි වූ අතර පසුගිය වර්ෂයේ සහනාධාර සඳහා වැයකළ මුදලින් පාසල් 1,300 ක් පමණ හෝ මූලික රෝහල් 160 ක් පමණ ඉදිකළ හැකිව තිබුණි. මීට අමතරව, සමාගම් බදු නිදහස් කිරීම් සහ බදු සහන ලබාදීම වැනි සහනාධාර නිසා රාජ්‍ය ආදායම පහත වැටුණු අතර ඉන් බොහෝ සංවර්ධන කටයුතු අඩාල විය.

සහනාධාර නිසිලෙස කළමනාකරණය කිරීමේදී මතුවන ප්‍රධානතම ගැටලුව වන්නේ ඒවායෙහි ප්‍රමාණය, සහනාධාර කාට හිමිවන්නේද යනවග සහ ඒවා ප්‍රශස්ත ලෙස බෙදී යෑම සඳහා වන ගැටලු යනාදියයි. නිසි ලෙස ඉලක්කගත කිරීම තුළින් අවශ්‍ය පුද්ගලයින්ට පමණක් ලබාදීම හරහා සහනාධාර අඩුකිරීම මගින් සහනාධාර හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම් අවම කරගත හැකිය. සහනාධාර අඩුකිරීමේ ඇති අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණ ද විශේෂයෙන්ම සහනාධාර ක්‍රියාවලියේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව එකඟතාවයක් නොතිබීම සහ විවිධ කණ්ඩායම්වලින් ඇතිවන බලපෑම් හේතුවෙන් එවැනි ප්‍රතිසංස්කරණමය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට අවකාශ නොලැබේ.

සහනාධාර දීම වඩාත් නිවැරදිව කිරීම තුළින් ආර්ථිකය ප්‍රශස්ත මට්ටමට ක්‍රියාත්මක වීමට ඇති බාධාවන් ඉවත් කරගත හැකිවන අතර, ඒ තුළින්, කාර්යක්ෂමතාවය හා ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීමට අයවැය කෙරෙහි ඇතිවන බලපෑම අඩුකර ගැනීමට හා අත්‍යවශ්‍ය රාජ්‍ය ආයෝජන කැපී පෙනෙන ලෙස පුළුල් කිරීමටද හැකියාව ලැබේ.

### 1.3 මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව, ගැටලු හා ප්‍රතිපත්ති

- **2006 රාජ්‍ය අයවැය ලේඛනය සමඟ ප්‍රකාශයට පත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව තුළින් සාර්ව ආර්ථික ස්ථායිතාවයෙහි වැඩි දියුණුවීමත් සමඟ ආර්ථිකය ඉහළ වර්ධන මාවතකට ප්‍රවිෂ්ට වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ප්‍රාදේශීය සංවර්ධනය සඳහා විශේෂ අවධානය යොමු කිරීම සහ සුනාමි ව්‍යසනයෙන් පසු ජාතිය යළි ගොඩ නැගීමේ රජයේ වැඩ පිළිවෙළ යටතේ ඉදිරියේදී ද.දේ.නි. වර්ධනය සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වර්ධනය, ඵලදායිතාව සහ ධාරිතාවය වැඩි දියුණු කිරීමේ ප්‍රතිලාභ ලබමින් ඉතිරිකිරීම් සහ ආයෝජන ඉහළ නැංවීම තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිතය. වැඩි දියුණු වූ දේශපාලනික සහ සාර්ව ආර්ථික වාතාවරණය, දේශීය සැපයුම වැඩි දියුණුවීම, ජාත්‍යන්තර ඉල්ලුම ඉහළයාම, ප්‍රේෂණ සහ විදේශීය සෘජු ආයෝජන තුළින් වර්ධනය වූ විදේශීය ලැබීම් සහ විදේශීය ආධාර විශාල වශයෙන් භාවිතා කිරීම යනාදියෙන් ප්‍රතිලාභ ලබමින් විදේශීය අංශය මැදිකාලීනව තවදුරටත් වැඩි දියුණු වේයැයි අපේක්ෂා කෙරේ. ජංගම ගිණුමේ අතිරික්තයක් ඇතිවන සේ

ආදායම් ඉහළ නංවාලීමේ සහ වියදම් අඩු කිරීමේ උපක්‍රම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව තවදුරටත් ශක්තිමත් කෙරේ. ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් සහ ඉහළ ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීම තුළින් රාජ්‍ය ආයෝජන ඉහළ යනු ඇති අතර, මැදි කාලීනව රාජ්‍ය ණය බර පහත වැටෙනු ඇත. මැදිකාලීන මුදල් ප්‍රතිපත්තිය සහ මූල්‍ය කළමනාකරණය මිල ස්ථායිතාවය පවත්වා ගැනීම ඉලක්ක කරමින් ආර්ථික වර්ධනයට පහසුකම් සලසනු ඇත.

- **මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ ඇති ඉලක්ක ළඟාකර ගැනීම සාධක කිහිපයක් මත රඳා පවතී**. ස්ථිර සාමයක් යළි ස්ථාපිත කිරීම ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට සහ ආර්ථික කටයුතු පුළුල්වීම කඩිනම් වීමට හේතු වනු ඇත. සාර්ව ආර්ථික ස්ථායිතාවය ඉලක්ක කොටගත් විචක්ෂණ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථික වර්ධනය සඳහා වන පූර්ව අවශ්‍යතා සහ සාධක ව්‍යාප්ත කළහැකි සේ ඵලදායී ප්‍රතිසංස්කරණ වැඩ සටහනක් තුළින් ආර්ථිකයේ ධාරිතාවය සැලකිය යුතු ලෙස ඉහළ නංවා ගත යුතුය. ප්‍රධානී/නියෝජිත ගැටලුව (Principal - Agent Problem) සහ අයුතු ප්‍රතිලාභ අපේක්ෂා කිරීමේ ගැටළුව (Rent seeking) ආදී අසමමිතික තොරතුරු සම්බන්ධ ගැටලුවලට සහ රාජ්‍ය අංශයේ වගකීම සහ බෙදාහැරීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීමේ ක්‍රියා මාර්ග ගැනීම මෙම ප්‍රතිසංස්කරණවලට ඇතුළත් වේ. මෙම උත්සාහයන් සමඟ මහජන දැනුවත් කිරීම්, විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ කාර්යභාරය සහ සීමාවන්, ලිහිල්කරණ සහ ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිලාභ, තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා වන පෞද්ගලික අංශයේ කාර්ය භාරය සහ ඔවුනට ස්වෝත්සාහයෙන් දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ට වීමට ඇති අවකාශ වැඩි කර ගැනීම වැනි අංශ සම්බන්ධයෙන් මහජන දැනුවත් කිරීම් කළ යුතුය. ඛනිජ තෙල් ගවේෂණය මගින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වේ නම් ශ්‍රී ලංකාව වෙළෙඳ අතිරික්තයක් පවතින රටක් බවට පත්විය හැකි අතර, ආර්ථික වර්ධන ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කිරීම සඳහා සම්පත් සැපයීමට ද හැකිවනු ඇත.

- **රජය විසින් දිගුකාලීන සාමය සඳහා කැප වී ඇති බව පැහැදිලිව පෙන්නුම් කර ඇත**. වෙළෙඳපොළ විශ්වසනීයත්වය සහ ආර්ථික සංවර්ධනය සඳහා ඇති අවස්ථා පුළුල් කරමින් 2006 වර්ෂයේ පෙබරවාරි මාසයේදී සාම සාකච්ඡා නැවත ආරම්භ විය.

- **වෙළෙඳපොළවල් වඩාත් කාර්යක්ෂමව ක්‍රියා කිරීම සඳහා හිතකර වාතාවරණයක් ඇති කිරීමට සහ ආර්ථික ස්ථායිතාවය පවත්වා ගැනීමට ද මෙතෙක්දුරට අත්කරගත් සාර්ව ආර්ථික ස්ථායිතාවය තවදුරටත් ශක්තිමත් කිරීමද අත්‍යවශ්‍ය වේ**. 2005 වසරේදී රාජ්‍ය ණය/ද.දේ.නි. අනුපාතය පහළ ගිය ද, නිරපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවත්නා ණය ප්‍රමාණය දිගුකාලීනව දරා ගත හැකි මට්ටමක පවත්වා ගැනීම අභියෝගයක් වනු ඇත. රාජ්‍ය ණය පාලනය කළ හැකි මට්ටමක පවත්වාගෙන යාමට සහ විදේශීය සංචිත ගොඩ නංවා ගැනීමට ප්‍රාථමික හිඟය සහ ජංගම ගිණුමේ හිඟය පහත හෙළීම සහ එමගින් ණය යහපත් මට්ටමක පවත්වාගෙන යාම සඳහා අතිරික්තයක් උත්පාදනය කිරීම අවශ්‍ය වේ. ශක්තිමත් සහ තිරසාර රාජ්‍ය මූල්‍ය ගැලපීම් ක්‍රියාවලියක් පවත්නා බව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනත (Fiscal Managenent Responsibility Act- FMRA) යටතේ ඇති මැදිකාලීන ඉලක්ක මගින් පෙන්නුම් කර ඇත. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව මගින් මුදල් ප්‍රසාරණය අඩු කිරීමට සහ මිල ස්ථායිතාවය පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම සලසනු ඇත. මුදල් සැපයුමේ වර්ධනය තවදුරටත් ඉහළයාම පාලනය කිරීම සඳහා මුදල් සැපයුමට බලපාන ප්‍රධාන සාධකයන්හි වර්ධනය, එනම්, පෞද්ගලික අංශයේ ණය සහ රාජ්‍ය අංශයට සපයනු ලබන ශුද්ධ ණය ප්‍රසාරණය අඩුකළයුතු වේ. පෞද්ගලික ආයෝජනයට අහිතකර නොවන ආකාරයට බැංකු මගින් පෞද්ගලික අංශයට ප්‍රදානය කරන ණය පාලනය කිරීම අවශ්‍ය වන අතර, බැංකු අංශයෙන් රජය ලබා ගන්නා ණය අඩුකළ යුතු වේ. නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාම මගින් අස්ථාවර බල වේගයන් ඇතිවීම වළක්වාලනු ඇත.

- **දිගුකාලීන විසඳුම් සොයා ගැනීමට අපොහොසත් වුවහොත් වර්තමානයේ ඉහළ මට්ටමක පවතින ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල ගණන් නිසා අහිතකර ප්‍රතිවිපාක ඇති කරනු ඇත**. වෙනත් විකල්ප බල ශක්ති මූලයන් නොමැතිකම නිසා තාප බලශක්ති උත්පාදනය ඉහළ නැංවීම හේතුවෙන් රටේ ඛනිජ තෙල් ආනයනය මත රඳා පැවැත්ම පසුගිය කාලය තුළ ඉහළ ගොස් ඇත. පරිභෝජනය සීමා කිරීම සඳහා සුදුසු මිල ගැලපීම් සිදු නොකළහොත් ඉහළ මට්ටමක පවත්නා තෙල් මිල, රාජ්‍ය මූල්‍ය සම්පත්, ගෙවුම් ශේෂය, විනිමය අනුපාතිකය සහ උද්ධමනය මත දැඩි පීඩනයක් ඇති කෙරෙන අතර, ලංකා විදුලි බල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වයද තවදුරටත් හීන කරනු ඇත. එමනිසා සාර්ව ආර්ථික රාමුව තුළ යෝග්‍ය ප්‍රතිපත්ති හඳුන්වාදීම, විකල්ප බලශක්ති මූලයන් ප්‍රවර්ධනය කිරීම, අකාර්යක්ෂම ඉන්ධන භාවිතය අවම කිරීම, බලශක්ති සම්බන්ධ රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඉහළ තෙල් මිල හා සම්බන්ධ අහිතකර සහනාධාර ක්‍රමයෙන් ඉවත් කිරීම ආදී ක්‍රියා මාර්ග මගින් ඉහළ යන තෙල් මිල නිසා ඇතිවිය හැකි පීඩනයට මුහුණ දීමට රටට ඇති ශක්තිය වැඩි කළ යුතුය. අනාගතයේ ඇතිවිය හැකි විදුලි ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි විදුලිබල මණ්ඩලය තම ධාරිතාවය පුළුල් කළයුතු වේ. එසේ නොවුනහොත් මැදි හා දිගුකාලීනව අපේක්ෂිත ඉහළ වර්ධන අපේක්ෂාවන් ඉටුකර ගැනීමට අපහසු වනු ඇත. මෑතකදී පවත්වන ලද භූ විද්‍යා සමීක්ෂණයකට අනුව බටහිර සහ වයඹ සාගර කලාපයන්හි තෙල්

**විශේෂ සටහන 4**

## ප්‍රධානී - නියෝජිත ගැටලුවේ (Principal Agent Problem) හා අයුතු ප්‍රතිලාභ අපේක්ෂාවේ (Rent Seeking) ප්‍රචලිතත්වය සහ එහි සාර්ව ආර්ථික බලපෑම

දියුණු මෙන්ම දියුණුවෙමින් පවතින රටවල් අසමමිතික තොරතුරු සහ අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව හා සම්බන්ධ ගැටලුවලින් හේතුන් දෙකක් නිසා පීඩා විඳී. ප්‍රථම හේතුව එවැනි ගැටලු ප්‍රචලිතව ඇති බව හඳුනා නොගැනීම වන අතර, දෙවැනි හේතුව වනුයේ එවැනි ගැටලු හඳුනාගෙන තිබුණ ද, ඒවා මර්දනය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීමය.

අසමමිතික තොරතුරු (Asymmetric Information) පිළිබඳ ගැටලුව යනු යම් ගනුදෙනුවකට හෝ ගිවිසුමකට අදළ එක් පාර්ශ්වයකට, එම ගනුදෙනුව හෝ ගිවිසුම සම්බන්ධ තීරණ ගැනීම සඳහා වඩා හොඳ හෝ වැඩි ප්‍රමාණයක තොරතුරු තිබීමයි. අසමමිතික තොරතුරු පවතින විට, එය අයහපත් වරණය (Adverse Selection), චර්යාමය උවදුර (Moral Hazard), ප්‍රධානි - නියෝජිත ගැටලුව සහ ඊට සහ අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව යනාදී ගැටලුවලට මග පාදන අතර, එය ආර්ථිකය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට ද සමහර අවස්ථාවලදී වෙළෙඳපොළ බිඳවැටීමකට ද හේතු වේ[1].

ප්‍රධානී - නියෝජිත ගැටලුව පැනනගින්නේ චර්යාමය උවදුර තුළිනි. කොටස්හිමියන්ට හෝ අයිතිකරුවන්ට සාපේක්ෂව ලාභ උපරිම කිරීම සඳහා කළමනාකරුවන්ට ඇත්තේ අඩු ප්‍රමාණයක දිරිගැන්වීමක් නිසා, ආයතනයක හෝ ආර්ථිකයක කළමනාකරුවන් (නියෝජිතයන්) තම කොටස්හිමි - අයිතිකරුවන්ගේ (ප්‍රධානීන්) අයිතිවාසිකම්/වාසි වෙනුවට වඩා තමන්ගේ අයිතිවාසිකම්/වාසි සඳහා කටයුතු කිරීමට ඇති ඉඩකඩ වැඩිවේ. මෙම චර්යාමය උවදුර රජයට හිමි ව්‍යාපාර කළමනාකරණයේ දී විශේෂයෙන් අදළ වේ. ප්‍රධානියා වශයෙන් රජයට (හෝ මහජනතාවට) රාජ්‍ය ව්‍යවසායන් මෙහෙයවීම සඳහා පත්කරන ලද නියෝජිතයන් මත විශ්වාසය තැබීමට සිදුවේ. සුදුසු දිරිගැන්වීමේ - දණ්ඩන ක්‍රමයක් බලනොපැවැත්වෙන කල්හි එම නියෝජිතයන් ප්‍රධානියා බලාපොරොත්තු වූ මට්ටමින් එම ආයතනය පාලනය නොකරනු ඇත.

අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව ද පැන නගින්නේ චර්යාමය උවදුර හේතුවෙනි. මෙහිදී පුද්ගලයින් හෝ ආයතන තමන්ට අනිසි ලෙස ලාභ ප්‍රයෝජනය ලබා ගැනීමට හෝ ජාතික සම්පත්වලින් කොටසක් තමන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා වෙන් කර ගැනීමට රජයට හෝ රටේ සම්පත්වල භාරකාරත්වය උසුලන අයට බලපෑම් කරනු ලබන අතර, එයින් විශාල සමාජයීය පිරිවැයක් ඇති කෙරේ. බදු අඩු කිරීම, තරගකාරිත්වයෙන් මිදීම සඳහා රේගු බදු පැනවීම, සහනාධාර ලබා ගැනීම, මහාමාර්ග වැනි පොදු භාණ්ඩ සැපයීමට අවහිර කිරීම සහ නිලධාරීන් හා දේශපාලකයින් විසින් විශේෂිත වූ කණ්ඩායම් සඳහා අනිසි ප්‍රතිලාභ ලබාදීම යනාදිය අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව සම්බන්ධ උදහරණ කිහිපයකි. මෙම තත්ත්වය 2005 වසර සඳහා වූ අයවැය මගින් මෙසේ පෙන්වා දී තිබුණි. *"ඇත්ත වශයෙන්ම, බදු සහනාධාර, රේගු බදු අඩුකිරීම්, බදු නිදහස් කිරීම්, වටිනාකම එකතු කළ බදු ප්‍රතිදන සහ එවැනි අනිකුත් සහන තුළින් ව්‍යාපාරික ප්‍රජාව නිරන්තරයෙන් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටින හා ලබා ගන්නා සහන ප්‍රමාණය, ඇස්තමේන්තුගත සමස්ත සහනාධාර ප්‍රමාණයට වඩා ඉතා විශාල වේ. රටේ අයවැය මත විශාල බරක් පටවමින්, සමාජයේ පොහොසත් හා බලපෑමක් ඇති කළ හැකි කොටස් විසින් භුක්ති විඳින මෙවැනි සහන නිසැකයෙන්ම සැබවුණු සහනාධාර වේ".* දිරිගැන්වීම් (සානුබල) පද්ධතිය විකෘති වීම, සම්පත් සාවද්‍ය ලෙස බෙදීයාම සහ අකාර්යක්ෂමතාව වර්ධනය වීම යනාදිය තුළින් අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව රටේ ආර්ථිකය මත විශාල පිරිවැයක් ඇති කරන අතර, ආර්ථික වර්ධනය ද අඩපණ කරනු ලබයි. ඵලදායීතාව වර්ධනය කිරීම හා නව සොයාගැනීම් තුළින් තරගකාරිත්වය වර්ධනය කිරීම වෙනුවට, අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව සඳහා සම්පත් යෙදවීමට ආයතන පෙළඹීමට ඉඩ ඇත. තවද, සමාජයේ විශේෂිත කණ්ඩායම් විසින් අනිසි ආකාරයෙන් ප්‍රතිලාභ ලබාගන්නා විට, එය ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී කරමින් , අනෙකුත් කණ්ඩායම් අතර කළකිරීම හා අපේක්ෂා භංගත්වය ඇති කරනු ඇත. අයුතු ප්‍රතිලාභ අපේක්ෂාව රටේ සම්පත් ප්‍රශස්ථ මට්ටමින් බෙදීනොයාමට හේතුවන අතර, එමගින් ඵලදයිතාව වර්ධනය කිරීමට ගන්නා ප්‍රයත්නයන් අඩපණ කළ හැකිය. තමන්ව යළි බලයට පත්කිරීම සඳහා උපකාර කළහැකි විශේෂිත කණ්ඩායම්වලට වැඩි වරප්‍රසාද ලබාදීමට, බලය ඇති කණ්ඩායම් ක්‍රියාකළ හැකිය. එවැනි තත්ත්වයක් යටතේ, නිලධාරීන් හා දේශපාලකයින් සමාජයේ යහපත පිණිස කටයුතු නොකිරීමට ඉඩ ඇත. මෙවැනි ක්‍රියාවන් නිසා ආර්ථික හා සමාජ සානුබල ව්‍යුහය විකෘති

1. ඇකර්ලෝෆ්, ජෝර්ජ් ඒ (1970). " The Market for ' Lemons' : Quality Uncertainty and the Market Mechanism." *Quarterly Journal of Economics*, 84(3), පිටු 488-500. ටියුලොක්, ජී. (1967). " The Welfare Costs of Tariffs, Monopolies and Theft." *Western Economic Journal*, 5, පිටු 224-232.

කරනු ලබන අතර, සුභසාධන පාඩු ඇතිකරමින් සහ ආර්ථික වර්ධනය අඩාල කරමින් එය අනිසි ලෙස සම්පත් බෙදාහැරීමකට මග පාදයි.

පාලන ක්‍රම දියුණු කිරීම, වගකීම් පැවරීම නිසි අයුරින් සහතික කිරීම, මනා ලෙස විගණනය කිරීම, ගනුදෙනු පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම සහ මහජනයා දැනුවත් කරනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය තුළින් අසමමිතික තොරතුරු හා සම්බන්ධ ගැටලු ඇතිවීමේ ප්‍රමාණය අඩු කළ හැකිය. ඊට අමතරව යහ පාලනය, පරිසරය සහ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් සිවිල් සමාජය දරන ප්‍රයත්නයන් ද මෙවැනි ගැටලු සමනය කිරීම සඳහා උපකාරී වේ.

තැන්පතු පවත්නා බව අනාවරණය වීම තුළින් පෙනී යන්නේ ලංකාව ඛනිජ තෙල් සම්පත් ලබා ගැනීමට වාසනාවන්ත වනු ඇති බවයි. කෙසේ වුවද, එම උත්සාහයන් තවදුරටත් වැඩි දියුණු කරන අතර, විකල්ප බල ශක්ති මූලයන් වර්ධනය කිරීමටත්, ගමනාගමනය ඇතුළු අනෙකුත් බල ශක්තිය භාවිතා කරනු ලබන අංශයන්හි කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමටත් සිදුවනු ඇත.

- **වර්තමාන යටිතල පහසුකම් ව්‍යුහය තුළ දැඩි ධාරිතා සීමාකම් පවතින හෙයින් අඛණ්ඩ ආර්ථික වර්ධනයක් සඳහා වැදගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව ඇත**. දිළිඳු බව පිටුදැකීම සහ වාණිජමය සේවාවන් ඇති කිරීම මෙන්ම ආර්ථික වර්ධනය පවත්වා ගැනීම සඳහා ආර්ථික හා සමාජ යටිතල ව්‍යුහයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ රාශියක් අත්‍යවශ්‍ය වේ. වර්තමාන සැපයුම් හිඟතාවන් හා මහා මාර්ග, විදුලිය, සංනිවේදන, ප්‍රවාහන, ජල සැපයුම, සෞඛ්‍ය, අධ්‍යාපන පහසුකම් ආදියේ ප්‍රාදේශීය අසමානතා මගින් ආර්ථික වර්ධනයට සීමාකම් ඇති කරයි. ග්‍රාමීය අංශය ආර්ථික මධ්‍යස්ථාන සමඟ යා කෙරෙන කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක් නිර්මාණය වී නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රාදේශීය සංවර්ධනය ළඟාකර ගත නොහැක. මෙම යටිතල ව්‍යුහය තවදුරටත් ව්‍යාප්ත කරමින් සෑම ප්‍රදේශයකටම සමාන අවස්ථා බෙදී යන ලෙස කටයුතු නොකළහොත් ප්‍රදේශයන් අතර, යටිතල පහසුකම්වල ඇති අසමමිතික ව්‍යාප්තිය හේතුවෙන් මහජන උද්ඝෝෂණයන්ට පවා තුඩු දීමට ඉඩ ඇත. මෙවැනි යටිතල පහසුකම් සේවා සපයන ආයතන ශක්තිමත් කළයුතු අතර, ඔවුන්ගේ කාර්යක්ෂමතාව සහ වගකීම් සහතික කළ යුතුව ඇත. අවම වශයෙන් නිෂ්පාදන පිරිවැයවත් පියවෙන ආකාරයට සේවාවන් මිල නොකරන්නේ නම් එම සේවා සැපයීම සඳහා රජයේ අයවැය මත රඳා පැවතීමට සිදු වේ. ඇතැම් අංශ සඳහා නිදහස් නියාමන වැඩ පිළිවෙලක් නොමැති අතර, දැනට පවතින නියාමන වැඩ පිළිවෙලවල් දුර්වල මට්ටමක පවතී. සෞඛ්‍ය සේවාව තුළ සේවක ආරවුල් බහුලව පවතින අතර, සෞඛ්‍ය සේවා සම්බන්ධව ආයෝජන ප්‍රමාණවත් හා නිවැරදි ලෙස ඉලක්කගත නොවීම වැනි ගැටලු පවතී. ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමය නිර්මාණය කිරීමට අධ්‍යාපන ක්ෂේත්‍රයට ද නොහැකි වී ඇති අතර, අධ්‍යාපනය සම්බන්ධව වෙළෙඳපොළ අවශ්‍යතා සහ සැපයුම අතර විශාල පරතරයක් ඇත.

- **කෙටිකාලීන අයවැය සීමාකම් සහ දිගුකාලීන ආර්ථික පිරිවැය සැලකිල්ලට ගෙන සමාජ සාධාරණත්වය, ආරක්ෂණය සහ සහනාධාර සඳහා පෞද්ගලික අංශය රජය මත අධික ලෙස යැපීම, තාර්කීකරණය කළ යුතුව ඇත**. ඕනෑම දියුණු ආර්ථිකයක් බොහෝදුරට ක්‍රියාත්මක වන්නේ පෞද්ගලික අංශයේ ප්‍රයත්නයන් මතය. පෞද්ගලික අංශයේ නිපුණතාවය, ව්‍යවසායකත්වය සහ සම්පත් හිමිකම ඉහළ ආදායම් උත්පාදනය සඳහා ආර්ථිකය මෙහෙයවනු ලබයි. ඉහළ සමාජ සහ ආර්ථික පිරිවැයක් යටතේ පෞද්ගලික අංශය රජයෙන් අනවශ්‍ය ආරක්ෂණයන් අපේක්ෂා කිරීමෙන් වැළකී, ඵලදායිතාය ඉහළ නැංවීම, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල අඛණ්ඩව නියැලීම සහ ගෝලීයකරණයේ අභියෝගවලට මුහුණ දෙමින් ඉන් ලබාගත හැකි ප්‍රතිලාභ අත්පත්කර ගැනීම, වැනි ද මගින් තරගකාරීත්වය තීව්‍ර කිරීම සඳහා පෞද්ගලික අංශය පියවර ගත යුතුය. ජාත්‍යන්තරව එල්ලවන තරගකාරීත්වයෙන් මිදීම සඳහා ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කිරීමෙන් ප්‍රතිලාභ ලැබිය හැක්කේ කෙටි කාලයකට පමණි. ඊට හේතුව වන්නේ තාක්ෂණයේ වැඩි දියුණු කිරීම් සඳහා දේශීය සහ විදේශීය තරගකරුවන්ගේ ප්‍රයත්නයන් මගින් ඵලදායිතාවය ඉහළයාම සහ නිෂ්පාදන හා ප්‍රවාහන පිරිවැය පහත වැටීමත් එමගින් වෙළෙඳපොළවල් සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට හැකියාව ලැබීමත්ය. එක් අංශයකට ආරක්ෂණය සැපයීමට ගනු ලබන ක්‍රියා මාර්ග අනෙක් සෑම අංශයකම නිෂ්පාද පිරිවැය ඉහළ යාමට හේතු වෙමින් සමස්තයක් වශයෙන් මුළු රටේම තරගකාරීත්වය හීන කරන අතර, එමගින් විශාල ආර්ථික පිරිවැයක් ද ඇති කරනු ලබයි. අසාර්ථක ලෙස ඉලක්කගත අත්‍යවශ්‍ය නොවන සහනාධාර මගින් අයවැය සම්පත් ඵලදායී ආයෝජනවලින් බැහැර වේ. එමනිසා, නිදහස් හා විවෘත ආර්ථික ප්‍රතිපත්ති, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, තරගකාරීත්වය හා ආරක්ෂණයෙහි හා සහනාධාරවල සුබසාධක පිරිවැය පිළිබඳව පොදු ජනතාව දැනුවත් කළ යුතු වේ.

## 1.5 සංඛ්‍යා සටහන
## මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව 2005 -2009

| දර්ශකය | ඒකකය | 2005 (අ) | පුරෝකථනයන් | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2006 | 2007 | 2008 | 2009 |
| **මූර්ත අංශය** | | | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | රු. බිලියන | 2,366 | 2,732 | 3,139 | 3,563 | 4,018 |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | % | 6.0 | 6.9 | 7.4 | 8.1 | 8.4 |
| උද්ධමනය/ද.දේ.නි. අවධමනකය | % | 9.9 | 8.0 | 7.0 | 5.0 | 4.0 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 26.5 | 30.0 | 32.0 | 33.9 | 34.8 |
| පෞද්ගලික අයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 19.6 | 21.6 | 24.3 | 26.2 | 27.0 |
| රජයේ ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 6.9 | 8.4 | 7.7 | 7.7 | 7.8 |
| දේශීය ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 17.2 | 20.5 | 22.0 | 24.8 | 26.4 |
| පෞද්ගලික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 19.9 | 21.4 | 21.5 | 22.7 | 23.5 |
| රජයේ ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | -2.7 | -0.9 | 0.5 | 2.1 | 2.9 |
| ජාතික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 23.3 | 26.5 | 27.8 | 30.5 | 31.9 |
| **විදේශීය අංශය** | | | | | | |
| වෙළඳ පරතරය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | -2,516 | -2,916 | -3,372 | -3,443 | -3,560 |
| අපනයන | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 6,347 | 6,995 | 7,748 | 8,585 | 9,460 |
| ආනයන | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 8,863 | 9,911 | 11,120 | 12,028 | 13,021 |
| සේවා | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 338 | 409 | 411 | 474 | 504 |
| ලැබීම් | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 1,540 | 1,737 | 1,888 | 2,062 | 2,245 |
| ගෙවීම් | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 1,202 | 1,328 | 1,477 | 1,589 | 1,741 |
| ජංගම ගිණුමේ ශේෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | -650 | -886 | -1,124 | -1,009 | -973 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -2.8 | -3.3 | -3.8 | -3.1 | -2.7 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 501 | 400 | 320 | 210 | 353 |
| විදේශීය නිල සංචිත (ආනයනික මාස) | මාස ගණන | 3.3 | 3.3 | 3.3 | 3.2 | 3.2 |
| ණය සේවා අනුපාතිකය (ආ) | % | 7.9 | 10.9 | 9.9 | 10.6 | 10.0 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ)** | | | | | | |
| ආදායම | ද.දේ.නි.යේ % වශයෙන් | 16.1 | 17.8 | 18.1 | 18.5 | 18.6 |
| වියදම | ද.දේ.නි.යේ % වශයෙන් | 24.7 | 26.9 | 25.3 | 23.5 | 23.6 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -2.7 | -0.9 | 0.5 | 2.1 | 2.9 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -8.7 | -9.1 | -7.2 | -5.7 | -5.0 |
| දේශීය මූල්‍යනය | ද.දේ.නි.යේ % වශයෙන් | 5.2 | 4.5 | 3.2 | 2.2 | 2.4 |
| **මූල්‍ය අංශය (ඈ)** | | | | | | |
| සංචිත මුදල් වර්ධනය | % | 15.8 | 15.0 | 14.9 | 14.5 | 13.0 |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) | % | 19.1 | 15.0 | 14.9 | 14.5 | 13.0 |
| පටු මුදල් වර්ධනය ($M_1$) | % | 22.4 | 13.0 | 12.9 | 12.5 | 11.0 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වර්ධනය | % | 21.5 | 16.0 | 19.3 | 17.0 | 13.6 |
| රාජ්‍ය අංශයට ණය දීම්වල වර්ධනය | % | 0.7 | 4.2 | -5.7 | -5.0 | -5.1 |

(අ) තාවකාලික
(ආ) මුළු ණය සේවා ගෙවීම් වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවාවන්ගේ ඉපැයීම්වල ප්‍රතිශතයක් වශයෙන්
(ඇ) සුනාමි සම්බන්ධ වියදම්ද ඇතුලත් කර ඇත.
(ඈ) වර්ෂය අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලය : 2006 වාර්ෂික අයවැය
ශ්‍රී ලංකා මහ බැංකුව

- **අවසාන වශයෙන්, රජය සිය සේවා සැපයීම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන මත යැපීම සහ ආර්ථික වර්ධනයට අවශ්‍ය ගාමක බලවේගයක් සැපයීම සඳහා පෞද්ගලික අංශයේ ආයතන මත යැපීම තහවුරු කිරීමට එම අංශයන්හි ඵලදායීතාවය, වගකීම සහ යහ පාලනය ඉහළ නැංවීම සඳහා ක්‍රම වේදයන් හඳුන්වාදිය යුතු වේ.** රජයට ප්‍රධාන පාලකයා වශයෙන් (Principal) රාජ්‍ය අංශයේ ආයතන කළමනාකරණය කිරීම සඳහා රජය විසින් පත් කරනු ලබන නියෝජිතයන් (Agent) මත විශ්වාසය තැබීමට සිදුවේ. එබැවින්, එම නියෝජිතයින් පෞද්ගලික ප්‍රතිලාභ සඳහා නොව සමස්තයක් වශයෙන් රටට ප්‍රතිලාභ ගෙනදෙන පරිදි ඔවුන්ට නියමිත කාර්ය භාරයන් ඉටු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා යම් ක්‍රමවේදයන් සහ ප්‍රතිසංස්කරණ වැඩ සටහනක් තිබිය යුතුය. පුද්ගලයන් සහ ව්‍යාපාරික ආයතන විසින් රාජ්‍ය යාන්ත්‍රණය විවිධ අයුරින් පෙළඹවීම මගින් ප්‍රතිලාභ ලබා ගැනීම, අයුතු ප්‍රතිලාභ (Rent Seeking ) ලෙස සැලකෙන අතර, එය දැඩි සමාජ හා ආර්ථික පිරිවැයක් ඇති කිරීමට හේතු වේ. ඉතා සුළු පිරිසකට ප්‍රතිලාභ ලැබුණ ද දනට පවත්නා බොහෝ සහනාධාර, සහන සහ ආරක්ෂණ ක්‍රියා මාර්ග විශාල සමාජ හා ආර්ථික පිරිවැයක් ඇති කිරීමට හේතු වී ඇත. වගකීම සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීමට රාජ්‍ය අංශය සඳහා සුදුසු ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුව ඇත.